2017 ඔක්තෝබර්
01 කාණ්ඩය මංගල කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට



# චේ

## නොනිමි අරගලයේ අඩසියවසක්

50
1967 - 2017


20 වන සියවසේ මිනිසා... 04
රාෆ්ටින් ක්‍රීඩාවේ අනාගතය... 08
අපේ රටේ තරුණයා... 11
විශ්වය බිහිවීම පිළිබඳ... 13











# පීඩිතයින් කෙරෙහි උසස්ම ආදරයත් අධිරාජ්‍යවාදයට එරෙහි දරුණුම වෛරයත් කැටි වූ හදවත... චේ CHE

මිනිස් ඉතිහාසය පිරී ඇත්තේ වඩාත් යහපත් ලෝකයක් හා යහපත් ජීවිතයක් පිළිබඳ අපේක්ෂාවන්ගෙනි. ඒ වෙනුවෙන් සිදුකළ සමාජ ක්‍රියාකාරීත්වයෙනි. ඉතිහාසයේ සිට අදටත් සිදුවන අරගලයන් තුළින් පෙන්වා දෙන්නේ සමානාත්මතාවයත්, සාධාරණත්වයත්, නිවහල් බවත් උදෙසා මිනිස් සංහතිය තුළ වන අපේක්ෂාව හා ධෛර්යයයි.

මේ අරමුණ වෙනුවෙන් සටන්වැදී ජීවිත පරිත්‍යාග කළ බොහෝ ආදරණීය මිනිසුන් අතර 'චේ' ද සුවිශේෂී පරමාදර්ශයක් වන්නේය. ඔහු සටන්කාමීත්වයේ සදාතනික සංකේතයයි. ඔහු දුක්විඳින මිනිසුන්ගේ විමුක්තිදායකයායි. තාරුණ්‍යයේ සදාකාලික සොඳුරු මිතුරායි.

වසර දෙකකට අධික කාලයක් පුරා සියෙරාමහේස්ත්‍රාවේ දී චේ ඇතුළු සගයන් විසින් සිදුකරන ලද දුෂ්කර ගරිල්ලා අරගලයකින් පසුව කියුබානු ජනයාට විමුක්තිය උදාවිය. එසේම සමාජවාදී කියුබානු රජයේ ප්‍රබල භූමිකාවක් ඉටුකළ චේ ඉන් නික්ම යන්නේ තම ජාත්‍යන්තරවාදී යුතුකම ඉටුකිරීම සඳහාමය.

අදින් අඩසිය වසකට පෙරාතුව බොලීවියානු දේශයේ දී අධිරාජ්‍යවාදීන්ගේ කුලී හමුදා විසින් ලොවට අහිමි කළේ එවන් මිනිසෙකි. සිය දිවියෙන් සමුගන්නා තෙක්ම ලොවපුරා සියලු පීඩිත ජනතාවට චේ ඉතා භක්තිවන්තව ආදරය කළේය. ඒ ආදරය නිසාම ඔවුන්ව පීඩාවට ලක් කළ අධිරාජ්‍යවාදයට එරෙහිව කොන්දේසි විරහිතව වෛර කළේය. එසේ ලොව උසස්ම ආදරයත් දරුණුම වෛරයත් කැටි වූ හදවතින් යුතුව ඔහු ලොවපුරා සැරිසැරුවේ තමන්ව අවශ්‍ය සටන්බිම කුමක්ද, ඒ ඕනෑම තැනක ඕනෑම තත්වයක් යටතේ අරගල කිරීමට සූදානමෙනි.

මිනිසෙකු තම ජීවිතය අනුන් වෙනුවෙන් කැපකිරීමට තීරණය කිරීම විශිෂ්ට වනවා සේම, තමන් නොදන්නා බිමක නොහඳුනන මිනිසුන් සමඟ පොදුජනයාගේ සතුරන්ට එරෙහිව දිවි පරදුවට තබමින් සටන් කිරීමට යාම සිතාගැනීමට නොහැකි තරමේ අද්විතීය ක්‍රියාවක් වන්නේය.

චේව මරා දමා අද වන විට වසර පනහක් ගතවී ද චේගේ පරම්පරාවේ සිට අඩසියවසක පරම්පරාවන් චේට ආදරය කරන්නේය. ජීවත් වූ චේට වඩා මියගිය චේ වඩාත් ප්‍රබලව අපට දැනෙන්නේ ඔහු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සටන්කාමී මිනිසෙකු වන නිසාය. උතුම් හදවතක් ඇති සහෘදයකු වන නිසාය. ලොවපුරා තරුණ තරුණියන්ට ධනවාදයේ කෲරත්වයට එරෙහිව, පීඩාවන්ට එරෙහිව සටන් වැදීමට, දෙපයින් සිටගැනීමට බොහෝ ආදර්ශයන් දුන් සටන්කාමී යෞවනයා චේ විය.

අයාලේ වල්වැදී යන තරුණ ජීවිත වෙනුවට ජීවයෙන් පිරි අරුත්බර අනාගතයක උරුමකරුවන් වන්නට චේ අපට මඟ කියාදී ඇත. ලෝකයට මරණය ගෙන එන, ලෝකයට යුද බිය ගෙනඑන, මිනිසුන් ජාති, ආගම් අනුව බෙදා වෙන්කර තබන, කුණු වී දුගඳ හමන මේ ධනවාදය වළ දමා ඒ මත නව සමාජයක් නිර්මාණය කළ යුතුව ඇත්තේ ඒ අනුවය.

අදින් වසර 50කට පෙරාතුව බොලීවියාවේදී තම අවසන් ප්‍රාණවායුව වාතලයට මුදාහරිමින් චේ බලාපොරොත්තු වූයේ වඩාත් සාධාරණ සමාජයක්ය. ඒ සඳහා ධෛර්යය ඇති මිනිසුන් අවශ්‍යව ඇත්තේය. තාක්ෂණයේ නව මංපෙත් ලෝකයම තනියායක් කර තිබෙද්දී එය සැබෑ ලෙසම මිනිස් හදවත් යා කෙරුණු තනියායක් බවට පත්කිරීමට චේ වැන්නවුන් වඩ වඩාත් අවශ්‍යව ඇත්තේය.

චේ වගේ වෙමු!

චේ ගෙන් උගනිමු!

## සයිටම් විරෝධි වැඩවර්ජනය සාර්ථකයි




මාලබේ සයිටම් ආයතනය අහෝසි කරන ලෙස ආණ්ඩුවට බලකරමින් පසුගිය 21 වැනි දා දිවයින පුරා එක්දින වැඩවර්ජනයක් ක්‍රියාත්මක විය. එය සයිටම් විරෝධී ජන පවුර සංවිධානය විසින් සංවිධානය කළ අතර වැඩවර්ජනය ඉතා සාර්ථක විය.

අධ්‍යාපන සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අයත් ආයතනවල වෛද්‍යවරු, හෙද හෙදියන්, සෞඛ්‍ය කාර්ය මණ්ඩල, විදුහල්පතිවරු, ගුරුවරු, පිරිවෙණ් ගුරුවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, අනධ්‍යයන සේවකයෝ ඇතුළු විශාල පිරිසක් මෙම වර්ජනයට එක් වූහ.

බොහෝ පාසල්වල ගුරුවරුන්ගේ සහභාගීත්වය ඉතා දුර්වල මට්ටමක පැවතීය. පුත්තලම හා හම්බන්තොට දිස්ත්‍රික්කවල පාසල් සම්පූර්ණයෙන්ම වැසී තිබූ අතර දිවයිනේ බොහෝ පාසල්වල 75%කින් ඉගැන්වීම් කටයුතු අඩපණ විය. රජයේ රෝහල්වල ද ඉතා සාර්ථකව වැඩවර්ජනය පැවැත් වූ අතර මාතෘ රෝහල්, ළමා රෝහල්, පිළිකා ආයතනය, වකුගඩු ආයතන හා හමුදා රෝහල්වල වැඩ වර්ජනය ක්‍රියාත්මක නොකළ අතර අනෙකුත් රෝහල්වලද හදිසි ප්‍රතිකාර පමණක් ක්‍රියාත්මක විය.

## වෙල්ලස්සේ අක්කර 62500ක ඉඩම් කොල්ලයට එරෙහිව ජනතාව පාරට බසී



අම්පාර, බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08කින් ඉඩම් අක්කර 62500ක් බහුජාතික සමාගමක් වන සිංගප්පූරුවේ ගැසල් වෙන්චර්ස් සමාගමට උක් වගා ව්‍යාපෘතියකට ලබා දී ඇත. ඒ තුළ ජනතාවගේ අයිතීන් උල්ලංඝණය වීමත්, ආර්ථික, සමාජයීය හා සංස්කෘතිකව සිදුවන බලවත් හානියත් වළක්වා ගැනීම උදෙසා, මෙම ඉඩම් කොල්ලයට එරෙහිව ජනතා විරෝධයක් පැන නැගී ඇත. ඒ අනුව පසුගිය 08 දින ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ පෙරමුණ විසින් සංවිධානය කරන ලද විරෝධතා පා ගමනක් පදියතලාව රෝහල අසලින් ආරම්භ විය. අනතුරුව පදියතලාව නගරයේදී රැළියක් ද පවත්වන ලදී.

මෙම අවස්ථාවට පරිසරවේදීන්, විද්වතුන්, පූජ්‍ය පක්ෂය, ආදිවාසී නායකයින්, ගොවි නායකයින් මෙන්ම වෙළඳ ව්‍යාපාරිකයින් ඇතුළු ප්‍රදේශයේ මහජනතාව විශාල පිරිසක් සහභාගී වූහ. එසේම ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ පෙරමුණේ කැඳවුම්කරු, ඌව පළාත් සභා මන්ත්‍රී සමන්ත විද්‍යාරත්න සහෝදරයා, සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා, ජ්‍යෙෂ්ඨ පරිසරවේදී උදුල බණ්ඩාර ඖෂධහාමි මහතා, අම්පාර දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පියතිස්ස සහෝදරයා හා ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ පෙරමුණේ සභාපති නීතීඥ සරත් කුමාර මහතා ඇතුළු පිරිසක් අදහස් දැක්වූහ.

## නව බදු පනතින් කලාවටත් බදු



නව බදු පනතෙන් කලා ක්ෂේත්‍රයටද විශාල ලෙස බදු පනවා ඇති අතර කලින් තිබූ බදු සහන සියල්ලම පාහේ අහෝසි කොට තිබේ. රටක සංස්කෘතියේ ජීවනාලිය බඳු කලාවට බදු ගැසීම නිසා නිර්මාණ බිහි නොවීමෙන් ඇති වන සංස්කෘතියේ ගරාවැටීම පරම්පරා ගණනකට බලපාන බව සමාජවාදී කලා සංගමය ප්‍රකාශ කරයි. ඒ සැප්තැම්බර් 06 දින පැවති මාධ්‍ය හමුවක් අතරතුරදීය.

මෙම මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. ජාතික සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා, ප්‍රවීණ රංගන ශිල්පී චන්ද්‍රසෝම බිංදුහේවා මහතා, ප්‍රවීණ රංගන ශිල්පිනී දීපානි සිල්වා මෙනවිය, ප්‍රවීණ සාහිත්‍යවේදී කීර්ති වැලිසරගේ මහතා හා ප්‍රවීණ කාටූන් ශිල්පී විනී හෙට්ටිගොඩ මහතා සහභාගී විය.

## යෝජිත නව බදු පනතට එරෙහිව දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක්




සේවක අර්ථසාධක අරමුදලත්, සේවක භාරකාර අරමුදලත් කොල්ලකෑම සඳහා අත්තනෝමතික ලෙස බදු අය කිරීමට යෝජිත නව බදු පනතට එරෙහිව වැඩකරන ජනතාව විසින් දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් දියත් කිරීමට තීරණය කොට ඇත. අගෝස්තු 27 දින මරදාන සමාජීය හා සාමයික කේන්ද්‍රයේ දී පැවති මාධ්‍ය හමුවක් අතරතුර අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා විසින් ඒ බව අනාවරණය කරන ලදී.

ආණ්ඩුවට මුදල් සොයාගැනීමට අවශ්‍ය නම් බදු වංචා කරන මහා පරිමාණ යකඩ ව්‍යාපාරිකයන් කීප දෙනාගෙන් බදු අයකරගත හැකි බවත් එයින් පමණක් රුපියල් මිලියන 20 000ක් පමණ අයකර ගත හැකි බවත් එසේ නොකර ඒ වෙනුවට රටේ වැඩකරන ජනතාවගේ මුදල් කොල්ල කෑමට නව බදු පනත හරහා උත්සාහ කරන බවත් ඊට කිසිසේත්ම ඉඩ නොතබන බවත් වසන්ත සහෝදරයා විසින් එහිදී වැඩිදුරටත් පවසා සිටියේය.

# “අලුත් දේ සමඟ ඉදිරියට යන අලුත් තාරුණ්‍යයට නව දේශපාලනයක් ගොඩනැගිය යුතුයි”

**ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා සමඟ කළ සංවාදයකි.**



**ඉදිරියේදී එන්න තියෙන මැතිවරණවලට ජ.වි.පෙ. සූදානම්ද?**

පළාත් පාලන මැතිවරණය මේ වන විට වසර දෙකහමාරකට ආසන්න කාලයක් පමාකොට තිබෙනවා. ඒ නිසා පළාත් පාලන මැතිවරණය පැවැත්වීම අත්‍යාවශ්‍ය සාධකයක් බවට පත්වී තිබෙනවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුව පත්වුවාට පසු මේ වනතෙක් කිසිදු මැතිවරණයක් පවත්වා නැහැ. ඒ නිසා පළාත් පාලන මැතිවරණයක් ඉක්මනින් පැවැත්විය යුතු යැයි අපි ආණ්ඩුවට බලකර සිටිනවා. ඒ වගේම එළඹෙන පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ මේ වන විටත් පූර්ව සූදානම් කිරීම් විශාල ප්‍රමාණයක් සිදුකර තිබෙනවා.

ඒ වගේම පළමුවෙන්ම, එතෙක් පැවති බැසිල් රාජපක්ෂ විසින් හඳුන්වා දෙන ලද විකෘති ඡන්ද ක්‍රමය වෙනස් කොට පළාත් පාලන මැතිවරණය නව ඡන්ද ක්‍රමයකට ගෙන ඒමට ලැබීම ජනතාව පැත්තෙනුත් අපේ පක්ෂය පැත්තෙනුත් ලබපු ජයග්‍රහණයක්. විශේෂයෙන්ම මෙය මනාප ඡන්ද ක්‍රමය අහෝසි වෙන, කොට්ඨාස ක්‍රමයට මන්ත්‍රීවරයෙක් ලැබෙන, සමානුපාතික මන්ත්‍රීවරු තෝරා ගන්නා ඒ වගේම ගම් මට්ටමෙන් නායකයන් ගොඩනැගෙන ඉතාමත්ම වැදගත් මැතිවරණ ක්‍රමයක්. යම් යම් අඩුපාඩු මධ්‍යයේ වුවත් යම් සාධාරණ මැතිවරණ ක්‍රමයක් සකස් කරන්නට මෙමගින් හැකියාව ලැබී තිබෙනවා.

මේ මැතිවරණ ක්‍රමය තුළ විශේෂයෙන්ම සෑම දිස්ත්‍රික්කයකම කොට්ඨාස සඳහා අපේක්ෂකයන් තෝරාපත්කර ගැනීමේ කටයුතු මේ වන විටත් අපි සිදුකරමින් සිටිනවා. ඒ සඳහා අවශ්‍ය වන පූර්ව සූදානම් කිරීම් සියලු දිස්ත්‍රික්ක මට්ටමින් සිදුකරමින් තිබෙනවා. ඒ වගේම මෙම මැතිවරණ ව්‍යාපාරය අපි අපේක්ෂා කරන බිම්මට්ටම දක්වාම පක්ෂයේ සංවිධාන යාන්ත්‍රණය ශක්තිමත් කරගනිමින් ග්‍රාමීය වශයෙන් නායකයන් ගොඩනැගීමට ඉතාම වැදගත් මැතිවරණයක්. ඒ නිසා ඊට අවශ්‍ය සියලු වැඩකටයුතු අපි මේ වන විටත් සූදානම් කර තිබෙනවා.

**අලුත් මැතිවරණ නීතිය තුළ තරුණ නියෝජනය අහෝසි කරලා කියලා චෝදනාවක් තියෙනවා නේද?**

විශේෂයෙන්ම පැවති පළාත් පාලන සමානුපාතික ඡන්ද ක්‍රමය තුළ තරුණ සංඛ්‍යාව නිශ්චිත කොට තිබුණා. 2012 දී බැසිල් රාජපක්ෂ විසින් ඉදිරිපත් කරන ලද එම පළාත් පාලන ඡන්ද ක්‍රමය තුළද තරුණයින් ඉන් ඉවත් කොට තිබුණා. ඒ නිසා නිශ්චිත ලෙස තරුණයන් සංඛ්‍යාව සඳහන් කොට නොතිබුණත් මෙම නව ඡන්ද ක්‍රමයේ අන්තර්ගතය තුළ තරුණයන්ට විශාල ඉඩප්‍රස්ථාවක් නිර්මාණය කරගැනීමේ හැකියාව තිබෙනවා. විශේෂයෙන් අපි දන්නවා, පැවති පළාත් පාලන මැතිවරණ ක්‍රමයේදී යම් අපේක්ෂකයෙක් එම මුළු ප්‍රාදේශීය සභාව තුළම තරඟ වැදිය යුතුව තිබුණා. ඒ නිසා ඔහුට මනාප එක්රැස් කරගැනීම සඳහා තමන්ගේ ගම් ප්‍රදේශය තුළ පමණක් නොවෙයි, මුළු ප්‍රාදේශීය සභාව තුළම වැඩකටයුතු කළ යුතුව තිබුණා. ඒ නිසා මුදල් තිබෙන අයට, බලය තිබෙන අයට, අයථා ලෙස ධනය එක්රැස් කරගත්ත අයට තමයි ඒ තුළ වඩාත් වැඩියෙන් ඉඩකඩ නිර්මාණය වුනේ. නමුත් මෙම

07 පිටුවට

# “අපට අවශ්‍ය මේ කුණු ගඳ ගහන System එක වෙනස් කර තරුණ පරපුරට හොඳ ජීවිතයක් ලබාදීමයි”

**සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා සමඟ කළ සංවාදයකි**



**තාරුණ්‍යය ඉලක්ක කර ගත් පත්තරයක් කරන්න හිතුනේ ඇයි ?**

සමාජවාදී තරුණ සංගමය විදිහට අපට අවශ්‍යයි අපේ මතය තරුණ තරුණියන් අතරට අරගෙන යන්න. ඒ සඳහා Fb එක හා web එක වගේ මාධ්‍ය භාවිතා කරමින් සිටිනවා. ඊට අමතරව පසුගිය කාලය තුළ අපි SYU ත්‍රෛමාසික සඟරාව නිකුත් කළා. නමුත් ඒවා වේගවත් මදි. ඒ නිසා තවත් වේගයෙන් හා වැඩි වැඩියෙන් අපේ මතය අරගෙන යාම සඳහා තමයි FORWARD නමින් මාසික පුවත්පතක් නිකුත් කිරීමට අදහස් කළේ. මෙය SYU ප්‍රකාශනයක් ලෙසයි එළිදකින්නේ.

**අලුත් පත්තරයේ නම “FORWARD” ඇයි මේ නම යෙදුවෙ ?**

ඇත්තටම “FORWARD” කියන්නෙ ඉදිරියට යනවා කියන තේරුමනේ. ඉතිං තාරුණ්‍යය කියන්නේ නිරතුරුවම ඉදිරියට යන සහ යා යුතු, ඒ වගේම අලුත් වෙන්න කැමති, අභියෝගවලට කැමති කොටසක්. ඒ නිසා ඔවුන් අභියෝගවලින් හා තාක්ෂණයෙන් සාධනීය ලෙස ඉදිරියට යා යුතුයි. ඒ සඳහා සටන් කළ යුතුයි. ඒ නිසා තමයි සටන් කරන තාරුණ්‍යය වෙනුවෙන් “FORWARD” කියන නම යෙදුවේ.

**තාරුණ්‍යය ආමන්ත්‍රණය කරන පත්තර ගොඩක් තියෙනවා. ඒ අතුරින් “FORWARD” වෙනස් වෙන්නේ කොහොමද ?**

ඔබ හරි. අද තාරුණ්‍යය වෙනුවෙන් විවිධ පුවත්පත් තිබෙනවා. නමුත් ඒවායේ අරමුණු විවිධාකාරයි. ඒ අතරින් බහුතරයක් කරමින් ඉන්නේ මෙලෝරහක් නැති මේ System එක පවත්වාගෙන යාමට කටයුතු කිරීමයි. මෙය දැනුවත්ව හෝ නොදැනුවත්ව සිදුවන දෙයක්. නමුත් SYU අපට අවශ්‍ය මේ කුණු ගඳ ගහන System එක වෙනස් කරමින්, ඒ සඳහා සටන් කරන තරුණ පරපුරකට මඟ පෙන්වීමටයි. එයයි “FORWARD” සහ අනෙක් පත්තර අතර වෙනස.

**අද තරුණයා කියලා කියන්නේ ක්ෂණිකව වගේම කෙටිකාලීනව ලැබෙන දේ තුළින් තෘප්තිමත් වෙන පිරිසක් බවට පත්වෙලා. මේ ගැන ඔබේ අදහස මොකක්ද?**

අද අපේ තාරුණ්‍යය ඇත්තටම මුහුණ දී තිබෙන ගැටලු වන්නේ අධ්‍යාපනය, රැකියාව, ආදරය හා විවාහය ආදිය ජය ගැනීම වගේම තමන්ටම කියලා ගෙයක්දොරක්, වාහනයක් ආදිය ගන්න එකයි. එහෙත් මෙම අවශ්‍යතා ජය ගැනීමට මඟක් නොමැති තාරුණ්‍යය අද වන විට ඔබ කිව්ව ආකාරයේ ක්ෂණික සහ කෙටිකාලීන තෘප්තියක් ලබන අය බවට පත් වෙලා. තමන් මුහුණ දී තිබෙන ඇත්ත ගැටලු ජයගන්න සටන් කරනවා වෙනුවට ඒ බොහෝ දෙනෙක් අද වෙන වෙන සිහින පසුපස හඹා යන්නන් බවට පත්වෙලා. ඒ නිසා SYU අපේ අරමුණ වී ඇත්තේ තාරුණ්‍යය මුහුණ දී සිටින ඒ ඇත්ත ගැටලු සඳහා විසඳුම් ලබාගත හැකි දිශාවකට ඔවුන්ව පෙළ ගැස්වීමයි.


**වත්මන් තාරුණ්‍යය කියන්නේ Smart Phone එකත් සමඟ ජීවත් වෙන අය. පොත්පත් කියවීමට කැමැත්තක් නැහැ. “FORWARD” සමත් වෙයිද මේ අභියෝගය ජයගන්න?**

තාරුණ්‍යය නවීන තාක්ෂණය සමඟ ජීවත් වීම හා ඉන් ඉදිරියට යාම වරදක් නොවෙයි. ඒ වගේම තාරුණ්‍යය අතර කියවීමේ අඩුවක් තියෙන බවත් අපි පිළිගන්නවා. නමුත් පුවත්පතක් තමා ඉලක්ක කරන කණ්ඩායමේ අවශ්‍යතා අනුව වෙනස් විය යුතුයි. ඔවුන්ට දැනිය යුතුයි මේ මාධ්‍ය ඔවුන් වෙනුවෙන් කටයුතු කරන බව. මේ සියල්ල අතරේ රටේ සියලුදෙනා අතරට ලෙහෙසියෙන්ම යා හැකි මාධ්‍යයක් පුවත්පතයි. ඒ නිසා අපි විශ්වාස කරනවා “FORWARD” හරහා අපට තාරුණ්‍යය වෙත ළඟා විය හැකි බව.

**අවසාන වශයෙන් අපේ රටේ තරුණයින්ට දෙන පණිවිඩය කුමක් ද ?**

තාරුණ්‍යය සතු නවීනත්වය සහ ශක්තිය තුළින් ඔබට දිනාගත හැකි දේ බොහෝයි. පවතින සමාජ ක්‍රමය තුළ ඔබටත් නොදැනීම ඔබට අහිමි කළ දේ ලබා ගැනීම සඳහා කළ යුතු සටනක් තිබෙනවා. අනිවාර්යය ලෙසම ඒ සටන මුවහත් වන්නේ නවීන සමාජවාදයේ හරයන් ඔබේ ජීවිතයට අත්පත් කරගත් විටෙකයි. ඒ නිසා ලෝකය වෙනස් කරමින් තාරුණ්‍යයේ සැබෑ ජීවිතය සොයා යන්න, ඒ වෙනුවෙන් සටන් කරන්න “FORWARD” හා එක්වන්න.

# 20 වන සියවසේ මිනිසා



විලදිමීර් ඉල්යිම් උල්යානොව් (ලෙනින්) 1870 අප්‍රේල් 10 දින ඔල්ගා නදිය අසබඩ සිම්බීර්ස්ක් නගරයේදී උපත ලැබීය. ළමා කාලය හා තරුණ කාලයේදී ඔහු ඔල්ගා නදිය අසබඩ සිම්බීර්ස්ක්, කසාන්, සමාරා, කුයිබිසෙයිඞ් යන නගරවල වාසය කළේය. ඔහුගේ සීයා ගුබේර්නියා ප්‍රදේශයේ උපත ලද ප්‍රවේණිදාස ගොවියෙකි. පියා ඉල්යා නිකලායෙවිච් කසාන් විද්‍යාලයේ උපාධිය ලබාගෙන ද්විතීක පාසල්වල ඉගැන්වීය. පියා ප්‍රගතිශීලී මතධාරියකු වූ අතර ගම්වල පාසල් සංවිධානය කරමින් ගුරුවරුන්ට ආධාර කළේය. රුසියානු නොවූ ජන කොටස්වලට අධ්‍යාපනය ලබා දීමටත් හේ ඉමහත් අවධානයක් යොමු කළේය. මව මරියා ඇලෙක්සන්ද්‍රවේනා වෛද්‍යවරියකගේ දුවකි. උල්යානොව් පවුලේ දරුවන් සය දෙනෙක් වූ අතර ඔවුන් අන්නා, ඇලෙක්සන්දර්, විලදිමීර්, ඔල්ගා, දිමිත්‍රි, මාරියා නම් විය. ඔවුන්ට නිදහස් මතධාරී පුළුල් අධ්‍යාපනයක් ලබා දීමටත් ඔවුන්ව කාර්යශූර, අවංක, නිහතමානී, කාරුණික පිරිසක් වශයෙන් ඇති දැඩි කිරීමටත් දෙමාපියන් විසින් කළ හැකි සෑම දෙයක්ම කරන ලදී. ඒ අනුව උල්යානොව් පවුලේ සියලුම ළමයි විප්ලවවාදීන් වශයෙන් ඇතිදැඩි වීම අහම්බෙන් සිදුවූවක් නොවේ.

ලෙනින් කුඩා අවධියේදී ප්‍රීතිමත් විනෝදකාමී ළමයෙක් වූ අතර හඬනගා කෑගසන ක්‍රීඩාවලටත් පිහිනීමටත් හිම ක්‍රීඩාවටත් මිතුරන් සමඟ එළිමහන් චාරිකාවලටත් ඇල්මක් දැක්වීය. ඔහු වයස අවුරුදු 09 දී සිම්බීර්ස්ක්, ද්විතීක පාසලට ඇතුළත් විය. සෑම අවුරුද්දක් අවසානයේදීම සිය දක්ෂතා සඳහා තෑගි දිනාගත්තේය. පාඩම් ගැටලුවලට මුහුණ දුන් පන්තියේ අනෙකුත් සගයන්ටද උදව් කළේය. ඔහු පුළුල් ලෙස පොතපත කියවීය. පුෂ්කින්, ලේර්මන්කව්, ගොගල්, තුර්ගේනෙව්, නෙක්‍රාසව්, සල්තිකොව්, ශෙද්‍රීන් සහ ලියෝ තෝල්ස්තෝයි වැනි ශ්‍රේෂ්ඨ රුසියානු ගත්කතුවරුන්ගේ කෘතීන්වලට මනාව හුරුපුරුදු විය. මීට අමතරව බෙලින්ස්කි, හර්සන් සහ පීසරෙව් ආදී විප්ලවීය ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කෘති කියවීම වැදගත් කොට ගත්තේය. චෙර්නිශෙව්ස්කිගේ " කළ යුත්තේ කුමක්ද" යන කෘතිය කෙරෙහි ඔහු සුවිශේෂී රුචියක් දැක්වීය.

සමාජ විද්‍යාව කෙරෙහි විශේෂ උනන්දුවක් දැක්වූ ඔහු 1887 දී රන් පදක්කමක් දිනා ගනිමින් උසස් පාසල් අධ්‍යාපනය අවසන් කර කසාන් විශ්වවිද්‍යාලයේ නීති පීඨයට ඇතුළු විය. 1887 දෙසැම්බර් මුල් භාගයේදී ඔහු රහසිගත ශිෂ්‍ය රැස්වීමකට සහභාගී වීම නිසා විශ්වවිද්‍යාලයෙන් නෙරපා හරින ලදී. ඉන්පසුව සිරභාරයට පත් වී පසුව කොකුෂ්සිනෝ නැමැති ගමට පිටුවහල් කරන ලදී. ඔහු ජීවිතයේ වඩාත් වැඩියෙන්ම පොත් කියවූයේ එහිදීය. ඔහු වයි. පෙදොර්සෙයෙව් ගේ මාක්ස්වාදී අධ්‍යයන කවවලට සම්බන්ධ විය. මාස 18 න් වසර හතරක විශ්වවිද්‍යාල පාඨමාලාව තනියම උගත්තේය. සාන්ත පීටර්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ විභාගය විශිෂ්ඨ ලෙස සමත් වූ අතර ගෞරව උපාධියද දිනා ගත්තේය. අනතුරුව උසාවියේ නීතිඥයෙකු වශයෙන් පෙනී සිටියේය. ඔහුගේ දායකයන් වූයේ දුප්පත් ගොවීන්ය.

සිය පවුලේ ශික්ෂණය ඔහු විසින් කියවන ලද ප්‍රගතිශීලී රුසියානු සාහිත්‍යය හා තමා අවට පරිසරය නිරීක්ෂණය ආදී සෑම කරුණක්ම තරුණ ලෙනින්ගේ චරිතය ගොඩනැංවීමට බලපෑවේය. සූරාකන්නන් කෙරෙහි වෛරයත් සූරාකනු ලබන්නන් කෙරෙහි අනුකම්පාවත් පාසල් යන අවදියේදීම ඔහු තුළ ජනිත විය. පාසල් රචනාවක් සඳහාද පීඩිත පංතිය ගැන සඳහන් කිරීමෙන් මුල් ගුරුවරයාගේ තරවටුවට ලක්විය. මේ අතර දැඩි අධිෂ්ඨානයෙන් හා උසස් ප්‍රතිපත්තිවලින් හෙබි සිය සොහොයුරා ඇලෙක්සන්දර් ලෙනින් කෙරෙහි ඉමහත් බලපෑමක් ඇති කළේය. ඔහුගේ මාක්ස්වාදී සාහිත්‍යයේ මුල් ගුරුවරයා වූයේ සෙහොයුරාය.

මෙම කාලය වන විට රුසියානු පීඩිත පංතියට සිය විමුක්තිය දිනා ගැනීමට හැකිවනුයේ සමාජවාදයේ ජයග්‍රහණය සහතික කිරීමෙන් පමණක් බවත් එහි දෘෂ්ටිමය අවිය ඇත්තේ මාක්ස්වාදය තුළ බවත් තරුණ ලෙනින් දුටුවේය. මේ අනුව යමින් 1892 ලෙනින් විසින් ප්‍රථම වරට මාක්ස්වාදී අධ්‍යාපන කවයක් සංවිධානය කරන ලදි. එහි සාමාජිකයන් ලෙස විප්ලවකාරී අදහස් දැරූ තරුණ පිරිසක් සිටියේය.

ලෙනින් නිතරම පාහේ රුසියානු ගැමි ජීවිතයේ ඉතා සමීප නිරීක්ෂණයන් සිදු කළේය. ගොවීන් සමඟ කතා කළේය. ඔවුන්ගේ ජීවන තත්වය ගැන ඔවුන්ගේ කතාවලට සාවධානව ඇහුම්කන් දුන්නේය. පසුව ඔහු විසින් "ගොවි ජන ජීවිතයේ නව ආර්ථික වර්ධනයක්" නමින් ලිපියක්ද ලිව්වේය.

1887 දී නැවත වරක් පිටුවහල් කිරීමකට ලක්වෙන ඔහු නැගෙනහිර සර්බියාවට අවුරුදු 3කට පිටුවහල් විය. 1890 දී ගිනි පුපුර ගින්නෙන් දැල්වෙනවා යන අර්ථය ඇති රුසියාවේ බුද්ධියේ දරුවා වන ස්ක්‍රා පුවත්පත ජර්මනියේ සිට බිහිකිරීමට ලෙනින්ට හැකි විය. 1901 දී ලෙනින් යන ව්‍යාජ නාමයෙන් ලිපි ලිවීමට ඔහු යොමු විය. 1902 දී "කළ යුත්තේ කුමක්ද" යන ලෙනින්ගේ පොත පළ කරන ලදී. 1903 දී පක්ෂයේ වැඩපිළිවෙළ ගොවීන් වෙත ගෙනයාම සඳහා "ගැමි දුප්පතුන් වෙත" යනුවෙන් ලිපියක් පළකළේය.

බලය සඳහා සිය අරගලයේදී නිර්ධන පංතියට සංවිධානය වීම හැර අන් අවියක් නොමැත යන කරුණ එහිදී ඔහු අවධාරණය කළේය. 1905 දී "සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙකක්" නමැති කෘතිය පළකරන ලදී. මේ වන විට රුසියාව සාර් රජුගේ දැඩි පීඩනයට ලක්ව තිබිණි. ඒ අනුව යමින් ලෙනින් සෙබළුන්ට සාමය, ගොවීන්ට ඉඩම්, ජනතාවට පාන් යන තේමාව යටතේ මුළු රුසියාව පුරාම විප්ලවය සඳහා ජනතාව දැනුවත් කිරීම සිදුකරමින් විප්ලවය සඳහා පක්ෂයක් සූදානම් කිරීමේ කාර්යය විශිෂ්ඨ ලෙස සිදුකළේය. ඒ අතර ජනතාව අතර ගැටලු පැන නගින න්‍යායික කරුණු ලිපි මඟින් විශිෂ්ඨ ලෙස නිරාකරණය කරමින් ස්ක්‍රා පුවත්පතද ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍යක් කොට ගත්තේය. 1917 ඔක්තෝම්බර් විප්ලවයෙන් පසු මුළු පෘථිවියෙන් 6/1 ක භූමි භාගයකට හා එහි ජීවත් වූ ජනතාවට සාධාරණ සමාජයක් උදාකර දුන් අතර රුසියාවට අමතරව අසල්වැසි රටවලට පවා සමාජවාදී විප්ලවයේ සුවඳ හරින ලදී. පසුව අසල්වැසි රටවල්ද එකතුව සෝවියට් දේශය නම් මහා රාජ්‍ය නිර්මාණය කළේය. මේ වන විට තුන්වන ජාත්‍යන්තරය පිරිහී තිබූ තත්වයක් තුළ මෙවැනි කාර්යයභාරයක් කිරීමම විශිෂ්ඨ වන්නේය.

ලෙනින්ගේ ජීවන චරිතය ගත් විට අපගේ ජීවිතවලට ආදර්ශ ගත හැකි කරුණු කාරණා බොහෝය. දුෂ්කරතා මධ්‍යයේ වැඩකිරීමේ ගුණය, මූලික උපාය උපක්‍රම දක්ෂ ලෙස තෝරා ගැනීම, නිවැරදි තීන්දු ගැනීම, භාෂා කීපයක්ම හැසිරවීමේ හැකියාව, විවේක නොගෙන වැඩ කිරීම, කොයිතරම් වැඩකටයුතු තිබුණද ඒවා සියල්ල හොඳින් කළමණාකරණය කරමින් වැඩකිරීම ආදිය ඉන් කිහිපයක් පමණි.

ලෙනින්ගේ කෘතින් විසින් මාක්ස්වාදයේ සංවර්ධනයට උසස් සේවයක් ඉටු කළා සේම එහි ප්‍රායෝගිකත්වයද විද්‍යාමාන කළේය. ලෙනින් විප්ලවයේ ශ්‍රේෂ්ඨතම විද්‍යාඥයා විය. ඔහු මාක්ස්වාදයේ සියලුම සංයුක්ත කොටස් දර්ශනවාදය, දේශපාලන ආර්ථික විද්‍යාව සහ විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය නව නිගමනයන් සහ යෝජනාවලින් පෝෂණය කළේය. ලෙනින්ගේ ශ්‍රේෂ්ඨ දායක වීමකින් තොරව අපේ යුගයේ මාක්ස්වාදය වටහාගත නොහැකි විය හැකිව තිබුණි. මාක්ස්වාදය මේ මහ පොළොව මත ප්‍රායෝගිකත්වයට පත් කළ පුද්ගලයා ලෙනින් විය.

## ජීවිතය හුස්ම නම්...

නිමේෂයකට නහය, කට වසාගෙන ඔබේ හුස්ම හිරකරගෙන සිටින්න. ඔබට දැනෙන අපහසුව නිසාවෙන්ම ඔබ වහා හුස්ම ගැනීමට පෙළඹෙයි. ඔබ මෙතෙක් ජීවිතය කියා සිතා සිටි දේ ගේදොර, මිලමුදල්, යානවාහන, ආදරය, විවාහය, දරුවෝ මේ සියලු දේ කුමක්ද? දරුවෙක් මව් කුසින් එළියට පැමිණි පළමු මොහොතේම ආශ්වාස කරනා හුස්ම තුළින් එම දරුවාගේ ජීවිතය ආරම්භ වෙයි. පුද්ගලයෙකුගේ අවසාන මොහොතේ දී ශරීරයට ලබාගත් හුස්ම අවසන් වශයෙන් පිටකර නැවත හුස්මක් නොගන්නේ නම් ඒ ඔහුගේ මරණයයි.

ඉතිං ඔබ දුක්මහන්සියෙන් හෝ සොරකම් කර හෝ එකතු කරගත් භෞතික වස්තු සියල්ලමත් ඔබ ගොඩනගාත් බැඳීම් සියල්ලමත් අන්අය කෙරෙහි පතුරවන ලද පීඩනයත් සමඟ ඔබ තුළ වූ බලපරාක්‍රමයත් යනාදී මේ සියල්ල ශරීරය තුළට ඇදගන්නා වූත් නැවත වාතලයට පිටකරන්නා වූත් හුස්ම නැමැති ප්‍රපංචය මත රැඳී ඇත. එයයි ජීවිතය නම්....

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112193721
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syulanka.com

# සටන් කරන තාරුණ්‍යයට

තරුණයන් යනු සමාජයේ වඩාත් සක්‍රීය මෙන්ම සටන්කාමීම කොටස වන නිසාම ඕනෑම සටනක ඉදිරියෙන් සිටින්නේ තරුණ ප්‍රජාවයි. ලොව පුරා තරුණයින් තම අයිතිවාසිකම් දිනාගැනීම වෙනුවෙන් සටන්වැද සිටින අතර ලොව පුරා ජයග්‍රහණය කරන ලද අරගලවලදී ද තරුණයින් ඉදිරියෙන්ම සිටියේය. තරුණයින් හැමවිටම සටන්කාමී වන අතර ලොවපුරා ධනවාදය විසින් සිදුකෙරෙන රැකියාවලින් නෙරපීම, වැටුප් කප්පාදුව, විශ්‍රාම වැටුප් කප්පාදුව, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවන්ගේ කප්පාදුව ආදියට එරෙහි තරුණයින් දැනුදු ලොවපුරා සටන් කරමින් ඇත.

එසේ සංවිධානය වූ තරුණයින් අද වන විට පවතින ධනවාදී ආණ්ඩුවලට එරෙහිව සටන් කරමින් සිටින අතර පසුගිය කාලයේ මැදපෙරදිග රටවල පැනනැගුණු "අරාබි වසන්තය" නමින් හැඳින්වූ අරගල සඳහා පෙරට ආවේද තරුණයින්ය. අද දවසේ ධනවාදයේ පීඩාවන්ට එරෙහිව සංවිධානය වීම වේගවත් වී ඇති අතර තාක්ෂණයේ දියුණුවත් සමඟ සන්නිවේදනය වේගවත් වීමද එයට ඉවහල් වී ඇත. නමුදු ලොවපුරා පවතින, ක්‍රමයට එරෙහි සටන් කිරීමේ මං ඇහිරීමට කටයුතු කරමින් සිටින ධනවාදය, ජාතිවාදය, ආගමික අන්තවාදයන් හා මත්ද්‍රව්‍ය වැනි ව්‍යසනයන්ට ලොව පුරා වෙසෙන තාරුණ්‍යය ගොදුරුකොට ඇත.

ලාංකීය සමාජය තුළද තරුණ සටන් ගණනාවක් පැනනැගි අතර වීරත්වයෙන් සටන් කළ තරුණ ප්‍රජාවක් එකී සටන් තුළදී අපට හමුවිය. ලාංකීය තරුණයාටද ඉහත කරුණු එක ලෙස බලපාමින් ඇති අතර මුහුණ දෙමින් ඇති ප්‍රශ්න ගැටලු ගණනාවක් වර්තමානයේ දී වඩා උග්‍ර අතට හැරෙමින් ඇත. තරුණයා තුළ වන රැකියාව, ආදරය, විවාහය වැනි බලාපොරොත්තු බිඳවැටීම හේතු කොටගෙන අපේක්ෂා භංගත්වයට පත්ව ඇත. හැමදාමත් ලාංකීය ධනපති පාලකයන් බොරු පොරොන්දු ලබාදෙමින් තරුණයින් රැවටූ අතර තරුණ ප්‍රශ්න විසඳන බවට වත්මන් ආණ්ඩුව දුන් පොරොන්දුවද කඩකර ඇත. අප රටේ තරුණ ප්‍රජාව අද වනවිට මෙකී තත්වය තේරුම් ගනිමින් සිටින අතර සටන්කාමී නායකත්වයක් හමුවේ සටන් කිරීමට පෙළගැසෙනු විනා තරුණයින්ට අන්‍යමක් ඉතිරිව නොමැත. එසේ නම් සටන්කාමී ඔබට, වත්මන් ලාංකීය තාරුණ්‍යයට අවැසි නායකත්වය දිය හැකිය. ඔබ වත්මනෙහි පවතින අයුක්තියට අසාධාරණයට එරෙහි සටන්කරුවා විය යුතුය. පෙරමුණ ගන්නා නැතහොත් නියමුවා විය යුත්තේය. එම අරගලයේදී අප ඔබත් සමඟය. මෙතැන් සිට සටන් කරන ඔබට මතවාදී අවිය වීමට FORWARD අප සූදානම්ය. මේ තැබෙන ඇරඹුම ඒ උදෙසා ය.

## සැප්තැම්බර් 02

බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති කොමිසම විසින් සාක්ෂි විමසන අවස්ථාවේදී අර්ජුන් ඇලෝසියස්ගේ දුරකථන සංවාද ඔස්සේ හෙළිකරගත් කරුණු ප්‍රකාශ වීමත් සමඟ පැහැදිලිවම ඔහු තම බෑනාගේ සමාගම වන ''පර්පචුවල් ට්‍රෙෂරීස්'' සමාගමට බැඳුම්කර වංචාව සිදුකිරීමට අදාළව තොරතුරු සැපයූ බවට වන කරුණු තහවුරු වී ඇත. එනිසා



මෙකී වංචාවට අගමැතිවරයාගේ මිතුරා වන අර්ජුන් ඇලෝසියස් වැරදිකරු බව සනාථ වී ඇත. නමුත් ඔහුව පොලීසිය මඟින් අත්අඩංගුවට නොගෙන සිටින්නේ ඇයිද යන පැනය ඕනෑම අයෙකුට නැගෙනු ඇත. සාමාන්‍ය පුරවැසියෙකු රු. 1000ක අක්‍රමිකතාවයක් සිදුකළද නීතිය ක්‍රියාත්මක කොට අත්අඩංගුවට ගෙන සිරගත කර එය අයකර ගැනීමට කටයුතු කරන ධනපති නීතිය රුපියල් මිලියන ගණනක් වංචා කළ පුද්ගලයින්ට නිදැල්ලේ සිටීමට ඉඩ දී බලා සිටී. නීතිය ක්‍රියාත්මක වීම දේශපාලන වුවමනාව මත සිදුවන්නක් බව මෙකී සිදුවීම මඟින් හොඳින්ම පෙන්වාදෙමින් ඇත.

## සැප්තැම්බර් 12

FB පිටුවලින් බොහෝ පිරිසක් බෙදා හැර තිබුණු පින්තූරයකින් කියවුනේ භික්ෂූන් වහන්සේලා පිරිසක් පිණ්ඩපාතයේ වඩිනා බවයි. පිණ්ඩපාතයේ වැඩීම අතීතයේ සිටම භික්ෂූන් වහන්සේලා විසින් කරගෙන ආ ක්‍රියාවක් වන අතර තමන්ට දානය සපයා ගත් එක් ආකාරයක් වූයේ ද එයයි. නමුදු වර්තමානයේ මේ පිණ්ඩපාතේ වැඩීම එවන්




කටයුත්තක් සඳහා නොව, සිල්රෙදි නඩුවට අදාළව නීතිය ඉදිරියේ වැරදිකරුවන් වූවන්ගේ වන්දි මුදල් ගෙවීම සඳහා කෙරෙන්නකි. අප දන්නා පරිදි භික්ෂූන් වහන්සේලා මෙතෙක් හොරුන් රැකීම වෙනුවෙන් පිණ්ඩපාතේ නොගිය අතර භික්ෂූනට නොගැළපෙන මෙකී ක්‍රියාවේ නිරතව ඇත්තේ පරාජිත දේශපාලඥයින්ට කඩේ යන පිරිසක්ය. ජනතාවගේ පැත්තෙන් ගත්විට මෙම කටයුත්ත තමන් දෙවරක් හම ගැසීමකි. ඉතා අසාධාරණ ලෙස ජනතාවගෙන් අයකරගන්නා බදු මුදල් හොරකම් කර සිදුකළ පාඩුව එකකි. ඒ හොරකම් කළ හොරුන්ගේ දඩ මුදල් ගෙවීමට නැවත ජනතා මුදල් ඉල්ලා සිටීම යනු දෙවරක් ගසා කෑමය.

## සැප්තැම්බර් 16

Fb පිටු අතර වූ අපූර්ව දසුනක් වූයේ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා කළුරට ජනතා පෙරමුණේ තරුණ සමුළුවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වී සිටීමයි. රටේ ජාතික සමගිය ගොඩනැගීම අප කාගේත් ප්‍රමුඛ අවශ්‍යතාවක් ලෙස පවතින මෙවන් වටපිටාවක ප්‍රධාන යැයි කියාගන්නා ධනපති දේශපාලන



පක්ෂ තම පැවැත්ම වෙනුවෙන් ඉතිහාසය පුරා ජාතිවාදය වැපිරීය. එහි ප්‍රතිඵලය වූයේ රට තිස් අවුරුදු යුද්ධයකට ඇද දැමීමය. යුද්ධය අවසන්ව යම් සංහිඳියාවක් ඇතිවෙමින් ඇති මෙවන් වටපිටාවක, ජාතික සමගිය ගොඩනැගෙන දිසාවට කටයුතු කිරීම අප කාගේත් වගකීමය. එය එසේ වුවත් පරාජිත ධනපති දේශපාලන කණ්ඩායම් තම පැවැත්ම වෙනුවෙන් ඉතිහාසයේ මෙන්ම අදත් ජාතිවාදය වැපිරීමේ ක්‍රියාවලියක නිරතව ඇත. එය ගොඩනැගෙන සංහිඳියාවට ප්‍රබල බාධාවක් වී ඇත. ජාතික සමගියත් ජාතිකත්වයන් අතර සහෝදරත්වයක් වෙනුවෙන් පෙනී සිටින ජ.වි.පෙ. වතුකරයේ දමිළ ජනතාව විසින් ඒ ලෙස පිළිගැනීම විශේෂයකි. එසේම වතුකරයේදී ජ.වි.පෙ. නායකයාට එවන් ආරාධනයක් ලැබීම රටේ සංහිඳියාව පැත්තෙන් ගත්තද ඉදිරි පියවරක්ව වන්නේය.

## සැප්තැම්බර් 20

සිල්රෙදි නඩුවේ විත්තිකරුවන් නිදහස් වීම සම්බන්ධයෙන් FB පිටු අතර නොයෙකුත් පළකිරීම් දක්නට ලැබුණු අතර මෙකී සිදුවීමෙන් බොහෝදෙනෙක් විමතියටද පත් විය. මෙවැනි බරපතල ඝනයේ මූල්‍ය වංචාවකට හසුව වසර තුනක සිරදඬුවමකට යටත් කළ වැරදිකරුවන් දින 14 කින්



යළි නිදහස් වන්නේ කෙසේද? මෙකී පැනය මෙම සිදුවීම ඇසූ බොහෝදෙනෙක් විසින් මතු කළේය. ඔබට මතක නම් මෙම නඩුතීන්දුව ප්‍රකාශ වීමත් සමඟම කලබල වී සිටි හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ප්‍රමුඛ ඒකාබද්ධ විපක්ෂය ලහිලහියේම අග්‍රාමාත්‍යවරයා මුණගැසිණි. ඒ සමඟ ඇති වූ සාකච්ඡාවේ ප්‍රතිඵලය මෙය නොවේද? දේශපාලන ඩීල් දැමීම මෙය නොවේද? සාමාන්‍යයෙන් පොදුදේපළ පනත යටතේ රු. 25000කට වැඩි රජයේ මුදල් වංචාවකදී ඇප නොදෙන නීතිපතිවරයා මෙම නඩුවේදී ඇප දීමට විරුද්ධ නොවූයේ ඇයි? එසේ කිරීමට රජය නියෝජනය කරන නීතිපතිවරයාට උපදෙස් ලැබුණේ දේශපාලන බලාධිකාරියෙන්ය යන්න හරි පැහැදිලිය. ඉඳින් "කිසියම් සමාජයක නීතිය යනු පාලක පංතියේ කැමැත්තයි" යන්න මේ සමඟ නැවතත් ප්‍රත්‍යක්ෂ නොවන්නේද?

Doctor 01

# ලිංගිකත්වය පිළිබඳ තරුණ තරුණියන් දැනුවත් විය යුත්තේ ඇයි ?

**වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි**

අද ලාංකේය තාරුණ්‍යය තුළ ලිංගිකත්වය පිළිබඳ දැනුම බොහොම අඩුයි. මොකද ඒ පිළිබඳව ඉගෙන ගන්න අවස්ථාවක් අපේ සමාජයේ නැහැ. පාසලේ දී වුනත් ඒ ගැන හරිහැටි උගන්වන්නේ නැහැ. ඒ නිසා තරුණ තරුණියන් බොහෝ පිරිසකට මේ පිළිබඳව බොහෝ ගැටලු තිබෙනවා. ඒ නිසා FORDARD අපි ඒ පිළිබඳව ඔබත් එක්ක කතා කරන්න හිතුවා. ඉතිං අපි වෛද්‍ය ශාන්ත හෙට්ටිආරච්චි මහතා සමඟ එක්ව මෙම ලිපි පෙළ ඔබට ඉදිරිපත් කරන්න සූදානම්.

**? ලිංගිකත්වය පිළිබඳ කෙටියෙන් හැඳින්වීමක් කළහොත්,**

ලාංකීය සමාජයේ ලිංගිකත්වය පිළිබඳව නිසියාකාරව හා විවෘතව කතා කෙරෙන්නේ බොහොම අඩුවෙන්. නමුත් ලිංගිකත්වය පිළිබඳ තොරතුරු වැරදි ආකාරවලට සොයන අයගෙත් අඩුවක් නෑ. මේ නිසා බොහෝවිට ලිංගිකත්වය හා ලිංගික සෞඛ්‍යය පිළිබඳව අපේ රටේ තරුණ තරුණියන් අතරට යන්නේ වැරදි තොරතුරු. ඔවුන් නවීන තාක්ෂණය යොදා ගෙන, විශේෂයෙන්ම අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු සොයනවා. මෙම වෙබ් අඩවි බොහොමයක් සැකසී තියෙන්නේ ලිංගිකත්වය හරහා වෙනත් අරමුණු සාක්ෂාත් කර ගැනීමටයි.

**? මොනවද මේ වෙනත් අරමුණු ?**

උදාහරණයක් ගනිමු. ලංකාවේ ඖෂධ අලෙවියේ ඉහළම අගයක් ගන්නේ ලිංගික උත්තේජන ඖෂධ. ඒවා අනවශ්‍ය ලෙස තරුණයන් අතර විකිණෙනවා. අන්තර්ජාලයේ වැරදි පණිවිඩවලට රැවටුන අය මිත්‍යාවට යනවා කියන්න එය එක් උදාහරණයක්.

**? එසේ නම් නිවැරදි ලිංගික අධ්‍යාපනයක් සඳහා ද්විතීක ලිංගික ලක්ෂණ සමඟින් ආරම්භයක් ලබා ගනිමුද ?**

ලිංගිකත්වය සහ ලිංගික සෞඛ්‍ය ගැන කතා කරද්දි ද්විතීක ලිංගික ලක්ෂණ පිළිබඳව පැවසිය යුතුයි. ඒවා නම් වැඩිවියට පත්වීමත් සමඟ ගැහැණු සහ පිරිමි සිරුරේ මෙන්ම මනසේද සිදුවන වෙනස්කම්. යෞවනත්වයට එළඹීමත් සමඟ ප්‍රජනක පද්ධතියේ සිදුවන වෙනස්වීම් සමඟ, ද්විතීක ලිංගික ලක්ෂණ පහළ වෙනවා. ගැහැණු හා පිරිමින්ට පොදුවේ සලකන වෙනස්කම් තිබෙනවා. දෙපාර්ශවයේම ලිංගික ඉන්ද්‍රියන් වර්ධනය වීම, කිහිල්ල හා ලිංගාශ්‍රිත ප්‍රදේශවල රෝම වර්ධනය වීම, කුරුලෑ වර්ධනය වීම ඉන් කිහිපයක්. පිරිමි ළමුන්ට පමණක් සිදු වන වෙනස්කම් ලෙස උරහිස් පුළුල් වීම, ස්වරාලය ඉදිරියට නෙරා ඒම, කට හඬ ගොරෝසු වීම මෙන්ම විශේෂයෙන්ම ශුක්‍ර මෝචනය සිදුවීම හඳුන්වන්න පුළුවන්. ගැහැණු ළමුන්ගේ සිදුවන වෙනස්කම් ලෙස උකුළ පුළුල් වීම, පියයුරු වර්ධනය, විශේෂයෙන්ම ආර්ථවය සිදුවීම පටන් ගැනීම දක්වන්න පුළුවන්. මේවා ඉබේ සිදුවන වෙනස්වීම් නොව, හෝමෝන පද්ධතියේ සිදුවන වෙනසත් සමඟ යෞවනයේ දී සිදුවන වෙනස්කම් වේ.



**? වෛද්‍යතුමනි යෞවනත්වයට එළඹීමත් සමඟ මනසේ සිදුවන වෙනස්කම් මොනවාද ?**

එහිදී සිතන පතන අයුරු වෙනස් වෙනවා. විශේෂයෙන්ම විරුද්ධ ලිංගික පාර්ශ්වය කෙරෙහි ඇති වන ආකර්ෂණය. මෙය හෝමෝන වෙනස් වීමත් සමඟ සිදු වන ස්වාභාවික දෙයක්. මෙහිදී විශේෂයෙන් කිව යුත්තක් තිබෙනවා. යෞවනත්වයට එළඹීමත් සමඟ ප්‍රජනනය සඳහා ඉඩ ලැබෙන පරිදි ප්‍රජනක පද්ධතිය සැකසෙනවා. ප්‍රජනනය සඳහා ප්‍රජනක පද්ධතිය සැකසුනාට මෙය ඒ සඳහා සුදුසු අවස්ථාව නොවේ. මේ නිසා යෞවනය ඉන් අනවශ්‍ය ප්‍රශ්න රාශියකට ගොදුරු වෙනවා. පෞද්ගලිකව මට රටේ සිටින තරුණ තරුණියන් රාශියකගෙන් කෙටි පණිවිඩ හා දුරකථන ඇමතුම් හරහා බරපතල ප්‍රශ්න යොමු වෙනවා. බොහෝ දෙනෙක් දැනුවත් නෑ යම් යම් දේවල් සඳහා යා යුතු අවස්ථාව හා කාලය මොකක්ද කියලා. නිවැරදිව දැනුවත් වීම අඩුයි. පාසල් අධ්‍යාපනය තුළ ලිංගික සෞඛ්‍ය පිළිබඳව කථා කළත් එය නිවැරදි ආකාරයෙන් සිදුවන්නේ නෑ කියන කාරණය පිළිගන්න වෙනවා. මාධ්‍ය හරහා ව්‍යාපාරික අරමුණක් ද කැටිව එන විවිධ දේ නිසාත් මේ තරුණ තරුණියන්ට වැරදි ආකාරයේ උත්තේජන ලැබෙනවා. ඒ අනුව ඔවුන් අමාරුවේ වැටෙනවා යන කාරණය පැහැදිලිව දකින්න තිබෙනවා.

**? ඔබ සඳහන් කළා පාසල් අධ්‍යාපනය තුළ නිවැරදිව ලිංගික අධ්‍යාපනය ඉගැන්වීම අඩුයි කියලා. මෙය පැහැදිලි කළොත්?**

මේ ප්‍රශ්නයේ තවත් පැත්තක් මූලිකවම කතා කළ යුතු වෙනවා. දශක තුනකට වැඩි කාලයක් තිස්සේ ලංකාවේ අධ්‍යාපන ක්‍රමවේදය සකස් වී තිබෙන්නේ විභාගය ඉලක්ක කරගෙන මිසක් සමාජ හා වටපිටාව ගැන හිතන්න ඉඩක් දෙන හෝ පොතපත කියවා සමාජය ගැන අවබෝධයක් ලබාගන්න ආකාරයට නොවේ. මට වසර හතක පමණ කාලයක් තුළ විශ්වවිද්‍යාලයට පැමිණෙන ළමුන් හමුවනවා. විශ්වවිද්‍යාලයට පැමිණිය ද මොවුන්ගේ ලිංගික අධ්‍යාපනය පිළිබඳ දැනුවත් වීම අඩුයි. විශ්වවිද්‍යාලයට පැමිණ ඇත්තේ විෂය කරුණුවලට ලකුණු ගැනීමෙන් මිසක්, සමාජය පිළිබඳ පුළුල් අවබෝධයක් තුළින් නොවේ. අනෙකුත් තරුණ ප්‍රජාව ගේ මේ සම්බන්ධ දැනුම සහ ඔවුන්ගේ දැනුම අතර ලොකු වෙනසක් නැහැ. ඒවා ඇත්තේ එකම මට්ටමකයි. දෙපිරිසම රැවටීම හා වැරදි ක්‍රියාවන් අතින්ද එකම මට්ටමේයි සිටින්නේ.

ප්‍රජනක පද්ධතියේ සාමාන්‍ය පිහිටීම ගැනවත් අවබෝධයක් නැති පිරිස් සිටිනවා. ආර්ථවය යෞවනත්වයේ මුල් අවධියේදී වෙනස් වෙනවාය යන්න හෝ ආර්ථව වේදනාව පිළිබඳව හෝ සමහර යෞවනියන් දැනුවත් වෙලා නැහැ. ඒවා සාමාන්‍ය දේවල්. නමුත් සමහරු දැඩි මානසික පීඩනයකින් සිටින්නේ. ආර්ථවය පිළිබඳ වැඩිදුර විස්තර ඉදිරි ලිපි පෙළේදී කතා කරමු.

පිරිමි ළමුන්ගේ වෘෂණ කෝෂ දෙක ප්‍රමාණයෙන් වෙනස් වෙනවා, පිහිටන ස්වභාවය වෙනස් වෙනවා, පරිසර උෂ්ණත්වය සමඟ වෙනස් වෙනවා. නමුත් මෙය රෝගී තත්ත්වයක් ලෙස සිතන පිරිමි ළමුන් සිටිනවා.

**? නුසුදුසු වයසේදී දුරදිග ගිය ලිංගික සම්බන්ධතා ගැන ඔබගේ අදහස කුමක්ද?**

මේ පිළිබඳව දැනීම මෙන්ම ජීවිතයේ වගකීම පිළිබඳව අවබෝධයේ අඩුලුහුඩුකම් රාශියක් තිබෙනවා. යෞවනත්වයට එළඹීමත් සමඟ විරුද්ධ ලිංගික පාර්ශ්වය කෙරෙහි ආකර්ෂණය ඇතිවෙනවා. ඒ සමඟම ආදරයක් ඇති වෙනවා. අතීතයේ දී මෙන් ලියුම් හුවමාරු කරගැනීමට සීමා වූ ආදර සම්බන්ධතා නොවේ අද තියෙන්නේ. ඊට වඩා බොහෝ දුරගිය සම්බන්ධතායි තිබෙන්නේ. ඒවාට සුදුසු වටපිටාවක් ද අද තිබෙනවා. විවාහයේදී සිදුවිය යුතු දේ ආදරය කරන කාලයේදී සිදුවන අවස්ථා බොහෝ ඉහළ ගිහින් තිබෙනවා. ඒ වගේම මේවා ලිංගික අධ්‍යාපනය තුළ රහසිගතව කතා කළ යුතු දේ ලෙස මම සලකන්නේ නෑ. ඉදිරි ලිපි තුළින් තවත් පුළුල්ව මේ පිළිබඳව කතා කරමු.

**සටහන: වෛද්‍ය රිසිනි විල්මා**

---

තරුණ ඔබේ ප්‍රශ්න ගැටලු මෙන්ම යෝජනා හා චෝදනා අපට එවන්න. FORWARD අප සූදානම් ඔබේ හඬට ඉඩක් දෙන්න. දැන්ම ලියන්න.

සංස්කාරක,
FORWARD පුවත්පත,
අංක 464/20,
පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

## bookiයෙන්




කැඩියන් උගේ පාරක අතපය හතර කපුරු සුවඳ කහ ගැල්වූ පොල් වතුර විසි වී බිඳේ දේවාලයෙ ගල් අතර සම්බෝලයට පොල් ගෙඩියක් නෑ ගෙදර



Everyone loves black motorcycle, black gadgets

But why hate black skin?
Stop Being Racist!



## අලුත් දේ සමඟ ඉදිරියට යන 03 පිටුවෙන්...



ඡන්ද ක්‍රමය මූලික ලෙසම ගම පදනම් කරගත්තක් නිසා ඡන්ද කොට්ඨාසය ප්‍රමාණයෙන් ඉතාම කුඩයි. පැරණි තත්වය හේතුකොට ගෙන තරුණයන් මැතිවරණ ව්‍යාපාරවලට එළඹීමේ සහ පෙළඹීමේ ඉඩකඩ අඩු වී තිබුණා. නමුත් වර්තමානයේ මෙම නව ඡන්ද ක්‍රමය තුළ තමන් තරඟ වදින කොට්ඨාසය කුඩාවීම නිසා තමන්ගේ ඥාතීන් හා හිතවතුන් සහිත ඉතා කුඩා වූ වපසරියකයි තමන්ගේ ඡන්ද බල ප්‍රදේශය පවතින්නෙ. ඒ නිසා එදා මැලි වූ තරුණයින්ට වඩාත් වැඩි අවස්ථාවක් තිබෙනවා. සෑම දේශපාලන ව්‍යාපාරයකටම තමන්ට නව නායකත්වයන්, නව සංවිධාන ගොඩනැගීම් අරමුණු කරගෙන මැතිවරණ ව්‍යාපාරය තුළ විශාල තරුණ තරුණියන් ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේවි යැයි අපි විශ්වාස කරනවා.

**අද රටේ පොදු තරුණයා තුළ ජ.වි.පෙ ට ඉඩක් නිර්මාණය වෙලා තිබෙනවාද?**

විශේෂයෙන්ම වර්තමානයේ අපේ රටේ තරුණයා පොදුවේ ක්‍රම විරෝධීයි. එය යම් අරාජිකත්වයක් දක්වාම, අරාජික මනෝභාවයක් දක්වාම ගමන් කරමින් තිබෙනවා. ඒ නිසා අප උත්සාහ කරන්නේ, එම නිතැතින්ම ක්‍රම විරෝධී තරුණයා කොහොමද දේශපාලනික මඟපෙන්වීමක් මඟින් ගොඩනංවන්නේ කියන සාධකය සාර්ථක කරගන්නයි.

පැරණි සාම්ප්‍රදායික දේශපාලන ව්‍යාපාරයන් දෙක පිළිබඳ අපේ තරුණයන් තුළ පවතින විවේචන සහ ඔවුන් විසින් ඒවා හාස්‍යයට ලක්කිරීම දෙස බලන විට එම දේශපාලන ව්‍යාපාරයන් දෙක කෙරෙහි තරුණයන්ගේ බිඳවැටීම ප්‍රකට වෙනවා. එම පක්ෂ කෙරෙහි තරුණයන්ගේ අපේක්ෂාවන් හා විශ්වාසයන් බිඳවැටී තිබෙනවා. ඒත් මේකෙන් කියන්නේ නැහැ, ජනතා විමුක්ති පෙරමුණ කෙරෙහි තරුණයන් විශාල ලෙස ආකර්ෂණය වෙමින් තිබෙනවා කියලා. නමුත් ඉතාමත් හොඳ විභවයක් තිබෙනවා. ඒ විභවය උපයෝගී කරගෙන තරුණයන් අප වෙත දිනාගැනීමට හැකියාවක් ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

**අවසාන වශයෙන් අප රටේ තාරුණ්‍යයට ඔබට කියන්න තිබෙන්නේ කුමක්ද?**

විශේෂයෙන්ම අපේ තරුණයන්ගේ අපේක්ෂාවන් සහ බලාපොරොත්තු විශාල ලෙස පුළුල් වී තිබෙනවා. 1980 දශකයේ තරුණයන් නොවෙයි දැන් සිටින්නේ. එම තරුණ, තරුණියන් වුවමනාවන් සහ අපේක්ෂාවන් ඉතා සීමාසහිත කොටසක් බවට අතීතයේදී පත්වී තිබුණා. ඔවුන්ගේ රැකියා, ඔවුන්ගේ සමාජ තත්වයන්, ඔවුන් අපේක්ෂා කරන අරමුණු සීමිත ක්ෂේත්‍රවලට පටු වී තිබුණා. නමුත් අද එහෙම නොවෙයි. තරුණ තරුණියන් විශාල ලෙස ලෝකයට විවෘත වී තිබෙනවා. ලෝකයේ අලුත් දැනුම, අලුත් සංස්කෘතීන්, කලාව, සාහිත්‍ය පිළිබඳ විශාල දොරටු විවෘත වී තිබෙනවා.

කෙසේ නමුත් මේ පාලකයන් විසින් අපේ තරුණයන් එම නව විවෘත වූ දොරටු දිසාවට ගමන් කරවනවා වෙනුවට ඒවා වසා දමා මුළුමනින්ම අතරමං කළ තරුණ පරම්පරාවක් ගොඩනඟා තිබෙනවා. එම නිසා මෙම ලෝකයත් එක්ක ඉස්සරහට යන, අලුත් දේ සමඟ ඉස්සරහට යන අලුත් තාරුණ්‍යයට අවශ්‍ය දේශපාලනයක් ගොඩනැගිය යුතුයි. ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණටත් ඔබටත් ඉතාමත් වැදගත් කාර්යභාරයක් පැවරී තිබෙනවා. එම කාර්යභාරයේදී ජනතා විමුක්ති පෙරමුණ නව තාරුණ්‍යය සඳහා අවශ්‍ය වන නායකත්වය ලබාදීමට සූදානම් බව මේ රටේ තරුණ පරම්පරාවට අප සහතික කොට කියා සිටිනවා.

# සරදියෙල්ගේ කොළම

සරදියෙල් කියන්නේ ලංකාවේ රොබින්හුඩ්. එංගලන්තෙ රොබින්හුඩ් වගේම ලංකාවේ සරදියෙලුත් කළේ එකම වැඩේ. තියෙන අයගෙන් අරගෙන නැති අයට බෙදලා දුන්නා. දෙන්නම හොඳ නාඹර තරුණයෝ. සරදියෙල් ඇතිනැති පරතරේට වෛර කළා. තියෙන උන්ගේ ලොකුකම්, ජඩකම්, අමනුස්සකම් සරදියෙල්ට පෙන්නන්න බෑ. ඒ වගේම තමයි තියෙන උන්ව රකින පොලිස්කාරයින්වත් සරදියෙල්ට අරහං. සරදියෙල්ට දවසක් සුද්දන්ගෙ කටු ලෙවකාපු පොලිස්කාරයෙක් වෙඩි තිබ්බා. සරදියෙල්ගෙ දකුණු අත වගේ ළඟින් හිටපු මාමලේ ඒ පොලිස්කාරයාට වෙඩි තිබ්බා, එතනම මැරිලා වැටෙන්න. තාමත් ලංකාවේ පොලිස් දිනය කියලා සමරන්නේ ඒ දවස තමා.

සරදියෙල් කියලා කියන්නෙ නියම රැඩිකල් කොල්ලෙක්. මනුස්සකම තමයි අංක එක. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ජාති භේද සතේකට මායිම් කළේ නෑ. හොඳම යාලුවා මරක්කල ජාතික මාමලේ, ආදරය කළේත් මාමලේගේ නංගිට. සුද්දො සරදියෙල්ට පුදුම බයකින් හිටියේ. එංගලන්තෙට පවා සරදියෙල්ගෙ වාර්තා ගිහිල්ලා තිබ්බා. හැම පාලකයෙක් වගේම සුදු පාලකයාත් හිතුවෙ සරදියෙල් අල්ලලා මරලා දැම්මම ඔක්කොම හරි කියලා. ඒ වුනාට සරදියෙල්ලා අමරණීයයි. මරලා දාන්න බෑ. අයුක්තිය, අසාධාරණයට එරෙහි තරුණයෝ අතර අදටත් සරදියෙල් ජීවත් වෙනවා. අද ඉඳන් සමාජවාදී තරුණ සංගමයේ **FORWARD** පත්තරේ මේ පිටුවේ නූතන සරදියෙල් තමන්ගෙ පෑනෙන් හටන පටං ගන්නවා. එදා වගේම බලහත්කාරයෙන් ජනතාවගේ ධනය සම්පත් මංකොල්ලකාපු සහ කන උන්ට විරුද්ධව තමයි සරදියෙල් පෑනෙනුත් සටන් කරන්නෙ. මිනිසුන්ගෙ සල්ලි හොරකන් කරපු අය වගේම හොරකන් කරන්න ඉන්න අයටත් රිද්දන්න මේ සරදියෙල් දෙපාරක් හිතන්නෙ නෑ.

සිංහල, දෙමළ, මුස්ලිම් සියලු හිත හොඳ ලංකාවේ කොල්ලො කෙල්ලන්ට සරදියෙල් එක වගේ ආදරෙයි. ඉස්සරහට එන්න තියෙන කලාපවලදි ලියන්න ඔබේ ප්‍රශ්න සරදියෙල්ට ලියලා එවනවා නම් තමයි හොඳ. ඔබට අපට අයිති දේවල් නොදී තියාන ඉන්න ඒ වගේම මේ රට විනාශ කරන උන්ගෙ වග විස්තර ඊළඟ කලාපයේ සිට ලියන්නම්. එතෙක් ඔබ සැමට ජය.

නූතන සරදියෙල්

# ජීවිතයට කැන්දන අපූරු පුරුද්ද කියවීම.....

එළැඹ ඇති ඔක්තෝම්බරය "කියවීමේ මාසය" ලෙස නම්කර තිබේ. මෙය ඇසීම කෙනෙකු තුළ සිනහ උපදවන කරුණක් වන්නටද පුළුවන. මන්ද කියවීම නැතහොත් සාහිත්‍යය පරිශීලනය වැනි කාර්යයක් කාල පරිච්ඡේද වෙන්කර සිදුකළ නොහැකි නිසාවෙනි.

එහෙත් ඉතාමත් කාර්යබහුල සමාජයක පොතපත කියවීම හා සාහිත්‍ය පරිශීලනය වැනි කටයුත්තක් වෙනුවෙන් කාලය වෙන්කිරීමට කාට නම් හැකිද? යන පැනය කෙනෙකුට ඇසිය හැකිය. එහෙත් මේ කාර්යබහුලත්වය හේතුවෙන් මිනිසා සහ මිනිස්කම අතර ඇති වන්නේ දැඩි පරතරයකි. ඉස්පාසුවක් නොමැතිව ශ්‍රමය වගුරුවමින් දිවිසරි කරගැනීමට වෙහෙසෙන මිනිසුන් අසංවේදී පුද්ගලයින් බවට පත්කොට ඇත. මෙසේ නිර්වින්දනය වූ මිනිසා පවතින සමාජ ආර්ථික ක්‍රමය තුළ ස්වකැමැත්තෙන්ම වහලෙක් බවට පත්ව ඇත. මේ නිසා සිදුව ඇති ඛේදවාචක ගණන අතිමහත්ය. මා පිය දූදරු සබඳතා, අඹු සැමි සබඳතා, ඥාති සබඳතා යන සියල්ල අද බිඳවැටෙමින් තිබේ. සමාජය තුළ ඉතිරිව ඇත්තේ විකිණීම් හා මිලදී ගැනීම් පමණකි.



මෙකී තත්වයෙන් මිදීම සඳහා මිනිස් හදවත් වඩා සංවේදී කළ යුතුව ඇත්තෙමු. ඒ සඳහා පොතපත කියවීම හා සාහිත්‍යය පරිශීලනය වෙත සමාජය වේගයෙන් නැඹුරු කළ යුතු වන්නෙමු. කිසියම් කෙනෙකු කියවීමට නැඹුරුතාවයක් දක්වන්නේ නම් ඔහුට යමක් ඉතා වේගයෙන් තේරුම් ගැනීමට හැකිය. ඒ සඳහා විධිමත් තෝරාගැනීමක් යටතේ කියවීම ප්‍රගුණ කළ යුතුය. කියවීම මිනිසා සම්පූර්ණ කරන බව කීවේ මේ නිසාය.

එහෙයින් අපව බැඳ දමා ඇති යදම් බිඳ දැමීමේ මාවත වන්නේ පළමුව එකී යදම් වැල් පිළිබඳ අවබෝධ කර ගැනීමයි. කියවීම තුළින් අපට අත්පත් කරගත හැකි දැනුම බොහෝය. අප ජීවත් වන ලෝකයට වඩා සුන්දර ලොවක් ඇති බව පසක් කරන ඉමිහිරිම පුරුද්ද කියවීමයි. ජීවිතයට නැවුම් බලාපොරොත්තු එක් කරන, ජීවිතය වෙනුවෙන් සටන් කරන්නට කියා දෙන බලාපොරොත්තුවේ පුරුද්ද කියවීමයි. ඒ නිසා ඔක්තෝම්බරයට පමණක් සීමා නොවී මුළු දොළොස් මහේදී ම කියවීමෙන් ජීවිතය ආලෝකමත් කර ගනිමු.



# පරිසරය බිලිගනිමින් සිදුකරන මිනි හයිඩ්‍රෝ මාෆියාව සහ

# වයිට් වෝටර් රාෆ්ටින් ක්‍රීඩාවේ අනාගතය

විදුලි බලය යනු වර්තමාන ලෝකයේ අනිවාර්ය මානව අවශ්‍යතාවයක් බවට පත්වී තිබෙන දෛනිකව ඉතා ඉහළ ඉල්ලුමක් වර්ධනය වන්නකි. 2017 වන විට ලංකාවේ සමස්ත විදුලිබල අවශ්‍යතාවය මෙගා වොට් 5685 කි. එයින් දැනට මෙගා වොට් 4018 ක් නිපදවනු ලැබේ. ඒ ජල විදුලිය මඟින් මෙගා වොට් 1726 ක්ද, තාප තෙල් මඟින් මෙගා වොට් 1215 ක්ද තාප ගල් අඟුරු මඟින් මෙගා වොට් 900 ක්ද හුළං බල ශක්තිය මඟින් මෙගා වොට් 48 ක් ද හා වෙනත් ආකාරයෙන් (සූර්ය කෝෂ ආදී ) මෙගා වොට් 45 ක්ද ලෙසය.

මේ දත්තයන් තවදුරටත් සමීපව නිරීක්ෂණය කරන විට පැහැදිලි වන කරුණු කීපයකි. එනම් ලෝකයේ බොහෝ රටවල් පරිසර හානි අවම නවීන බලශක්ති ප්‍රභවයන් වෙත ගමන් කරන විට,

01. ලංකාව තවමත් සාම්ප්‍රදායික සහ පරිසරයට දැඩි බලපෑමක් එල්ල කෙරෙන තාප තෙල්, තාප ගල් අඟුරු, ජල විදුලිය වැනි සාම්ප්‍රදායික බලශක්ති මත පදනම්ව කටයුතු කිරීම.

02. සමස්ත විදුලිබල නිෂ්පාදනයෙන් සුළං බලශක්තිය මෙගාවොට් 48 ක තරම් ඉතා අවම මට්ටමක පැවතීම. එසේම එයින් ලංකා විදුලිබල මණ්ඩලය සතුව ඇත්තේ මෙගා වොට් 3 ක ධාරිතාවයක් පමණි. අනෙක් කොටස පෞද්ගලික සුළං විදුලිබලාගාර වේ.

03. සූර්ය බලශක්තිය වැනි පරිසර හානි අවම ක්ෂේත්‍රයන් පිළිබඳව රජයේ ඉතාමත් අඩුම අවධානයක් පැවතීම වැනි තත්වයක් දැක ගත හැක.

රටක් ලෙස රටේ පරිසර පද්ධතිය රැකගනිමින් තිරසාර සංවර්ධන මාවතකට අවතීර්ණ වීමට අපට තවමත් හැකියාවක් ලැබී නොමැත. මෙම තත්වය අනාගතය පිළිබඳ බිය උපදවන්නකි.

ලංකාවේ ප්‍රධාන ගංගා හා අතු ගංගා ආශ්‍රිතව මෙගා වොට් එකක, දෙකක වැනි ඉතා කුඩා ප්‍රමාණයේ මිනි හයිඩ්‍රෝ ඉදිකිරීමේ වේගවත් වර්ධනයක් පසුග ිය කාලපරිච්ඡේදය තුළ දක්නට ලැබුණි. ඉන් අතිබහුතරයක් පුද්ගලික හිමිකාරිත්වය සහිත ඒවා වේ.

01. පුඩළු ඔය ජලවිදුලි ව්‍යාපෘතිය

02. පුනා ඔය ජලවිදුලි ව්‍යාපෘතිය

03. රම්බොඩ ඔය ජලවිදුලි ව්‍යාපෘතිය

04. කොත්මලේ ඔය ජලවිදුලි ව්‍යාපෘතිය

05. සීතාවක ගඟ ආශ්‍රිතව ඉදිකර ඇති කුඩා බලාගාර

06. කිතුල්ගල දී කැළණි ගංගාව ආශ්‍රිතව ඉදිකරනු ලබන බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාරය ඉන් බලාගාර කිහිපයකි.

මෙහිදී අපගේ අවධානය වැඩි වශයෙන් යොමු වූයේ කිතුල්ගල දී ඉදිවන ''බ්‍රෝඩ්ලන්ඩ්'' කුඩා ජල විදුලි බලාගාරය කෙරෙහිය. මෙගා වොට් 35ක ධාරිතාවක් අපේක්ෂා කරමින් කැළණි ගඟේ ප්‍රධානතම අතු ගංගා දෙකක් වන කෙහෙල්ගමු ඔය සහ මස්කෙළිය ඔය සම්බන්ධ කරමින් බ්‍රෝඩ්ලන්ඩ් විදුලිබලාගාරය ඉදිකෙරේ.

එහිදී කෙහෙල්ගමු ඔයේ ජලය කුඩා ජලාශයකට ගෙන එම ජලය කෙටි උමඟකින් මස්කෙළි ඔයට හරවයි. අනතුරුව දෙකෙහිම ජලය එකතු කර කිලෝමීටර් 04ක පමණ දුරක් භූගත උමඟක් මඟින් ගෙන ගොස් කිතුල්ගල ප්‍රදේශයේ පහළින් බලාගාරය ක්‍රියාත්මක කර නැවත එම ජලය කැළණි ගඟට යොමු කරවයි.

මෙම ව්‍යාපෘතිය මඟින් මේ වන විටත් පරිසරයට සහ එම ප්‍රදේශයේ ජන ජීවිතයටත් ඔවුන්ගේ ආර්ථිකයටත් ඉමහත් හානිකර බලපෑමක් එල්ල කර තිබේ. උමඟ නිසා (උමා ඔය මෙන්ම) නිවාස ගිලා බැසීම්, නිවාස ඉරිතැලීම් සිදුවී ඇත. ඊට අමතරව මෙහිදී සිදුවීමට නියමිතව තිබෙන බරපතලම දේ වන්නේ සංචාරක ආකර්ෂණයක් සහිත කිතුල්ගල ප්‍රදේශයේ දහස් ගණනක් දෙනා තම වෘත්තීය ලෙස සිදුකරමින් ජීවත් වන වයිට් වෝටර් රාෆ්ටින් ක්‍රීඩාවද විදුලි බලාගාරයේ ආරම්භයත් සමඟ අවසාන වීමයි.


එම ප්‍රදේශයේ මේ වන විට රාෆ්ටින් ක්‍රීඩාව සිදුකරන ස්ථාන 20 ක් පමණ පවතින අතර ඒ හරහා ජීවත් වන විශාල පිරිසකට, තම ජීවනෝපාය

ඉතිරි... 13 පිටුවට


The Gadget

# ලොව මවිත කළ හයිඩ්‍රජන් ලෝහය

ලෝකයේ මෙතෙක් කල් වායුවක් ලෙස හඳුනාගෙන තිබූ හයිඩ්‍රජන් වායුව ඉහළ පීඩනයක් යටතේ ලෝහයක් බවට පත් කිරීමට ඇමරිකාවේ හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයන් දෙදෙනෙකු පසුග ිය දා සමත් විය. ඔවුන් අතරින් එක් විද්‍යාඥයෙකු ශ්‍රී ලාංකීය විද්‍යාඥයකු වීම ශ්‍රී ලාංකිකයන් ලෙස අපට මහත් ආඩම්බරයකි. හයිඩ්‍රජන් වායුව යනු විශ්වයේ ඇති ඉතා සුලබ මූලද්‍රව්‍යයකි. එය ද්විපරමාණු වායුවක් ආකාරයෙන් පවතින අතර ඉතා සැහැල්ලු මෙන්ම ගිනිගන්නා සුළු මූලද්‍රව්‍යයක් වේ. මුලින්ම හයිඩ්‍රජන්වලින් ලෝහ නිෂ්පාදනය කළ හැකි බවට මතයක් ගොඩනැගුනේ 1935 වසරේ දීය. ඒ විග්නර් (Wigner) හා හන්ටින්ග්ටන් (Huntington) යන විද්‍යාඥයන් විසිනි. එතැන් පටන් විවිධ පර්යේෂණ සිදු කළද ඒවා මඟින් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය. නමුත් ඉන්




වසර 80කට පමණ පසු හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයින් වන මහාචාර්ය අයිසෙක් සිල්වේරා (Prof. Isaac Silvera ) හා ආචාර්ය රංග ඩයස් ( Dr. Ranga Dias ) හට හයිඩ්‍රජන් ලෝහය සොයාගැනීමට හැකි විය. එය පෘථිවිය තුළ මීට පෙර නොපැවති ලෝහයකි. මහාචාර්ය අයිසෙක් සිල්වේරා විද්‍යාඥයා විසින් වසර හතලිස් පහක් පමණ හයිඩ්‍රජන් ලෝහය පිළිබඳ පර්යේෂණ කර ඇති අතර ආචාර්ය රංග ඩයස් ශ්‍රී ලාංකීය විද්‍යාඥයා සිල්වේරා විද්‍යාඥයාගේ මඟපෙන්වීම යටතේ මීට වසර 03කට පෙර සිට එම පරීක්ෂණවලට එක් වී ඇත. දියමන්ති යොදාගනිමින් හයිඩ්‍රජන් මවුලවලට ඉතා ඉහළ පීඩනයක් ලබාදී හයිඩ්‍රජන් (H2) මවුල අතර පවතින පරතරය අඩුකර හයිඩ්‍රජන් පරමාණු දෙක වෙන්කර එය ලෝහයක් බවට පත් කිරීම මොවුන්ගේ උත්සාහය වී තිබිණි. හයිඩ්‍රජන් ලෝහය සොගැනීමත් සමඟම ලෝකය තුළ ඉතා වේගවත් වෙනස්වීම් සිදුවන බව නිසැකය. බලශක්ති, ප්‍රවාහන, පරිගණක හා ඉලෙක්ට්‍රෝන ආදී ක්ෂේත්‍රයන් හි ඉතා විශාල වෙනස්කම් සිදුවනු ඇත.




දැනට පවතින විද්‍යුත් සන්නායකවලින් විශාල විදුලි ප්‍රමාණයක් අපතේ යන අතර විශාල මුදලක් ද වැය වේ. එම සන්නායක සඳහා සන්නායකතාවය පවතින්නේ පහළ උෂ්ණත්වයක බැවින් ඒවා සිසිල් කිරීම සඳහා නයිට්‍රජන්, හීලියම් වායු භාවිතා කිරීමට සිදුවීම නිසා ඒවාට අධික වියදමක් දැරීමට සිදුවේ. එබැවින් හයිඩ්‍රජන් ලෝහය සුපිරි සන්නායක් ලෙස භාවිතා කිරීමෙන් ප්‍රතිරෝධයකින් තොර විදුලි රැහැන් නිපදවීම මඟින් විශාල බලශක්තියක් ඉතිරි කළ හැකි අතර වියදම ද අඩුකර ගතහැක. එසේම අති ප්‍රභල චුම්භක හා අධිවේගී පරිගණක ද නිපදවිය හැකිය. රොකට් සඳහා දැනට භාවිතා කරන ඉන්ධනවලට (ද්‍රව හයිඩ්‍රජන්) වඩා හතර ගුණයකින් කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ඝන හයිඩ්‍රජන්වලට හැකියාව ඇත. එය දැනට ලොව පවතින ප්‍රබලතම රොකට් යානා ඉන්ධන වර්ගය වනවාට නොඅනුමානයි. එමනිසා ඉදිරි අනාගතයේ දී අභ්‍යවකාශ පරීක්ෂණද ඉතා වේගවත්ව සිදු වනු ඇත. මෙම සොයාගැනීම මඟින් බ්‍රහස්පති සහ සෙනසුරු වැනි දැවැන්ත ග්‍රහලෝකවල හයිඩ්‍රජන් ලෝහය තිබෙන බවට පවතින මත විද්‍යාත්මකව තහවුරු වේ. හයිඩ්‍රජන් ලෝහය නිෂ්පාදනය කිරීමට විශාල වියදමක් වැය වෙතැයි පවතින මතයට පිළිතුරු දෙන එම විද්‍යාඥයින් පවසන්නේ එවැනි විශාල වියදමක් දැරීමට සිදුනොවනු ඇති බවත් ඒ සම්බන්ධ පරීක්ෂණ දිගින් දිගටම පවත්වනු ලබන බවත්ය.

Sports

# වීරයින් එළවීම සහ ගල් ගැසීම

ශ්‍රී ලංකාවට ක්‍රිකට් ලෝක කුසලානයට කෙළින්ම තරඟ කිරීමේ අවස්ථාව අහිමි වුයේ, අගෝස්තු මාසය තුළ පැවැත්වූ තරගාවලියෙන් ශ්‍රී ලංකා පිල තරඟ නවයට බිංදුවක් ලෙස පරාජය වීමත් සමඟ ය. පරාජය වූයේ ශ්‍රී ලංකා ක්‍රිකට් පමණක් නම් හිත හදාගැනීමට පිළිවෙන. ඒ කිසිවක් නිසා නොව නැවත ක්‍රිකට් ජයග්‍රහණය කළ හැකි නිසාවෙනි. එහෙත් ක්‍රිකට් සමඟ පරාජය වූ බොහෝ දේ ඒ අතරය. ක්‍රීඩාව මිනිසුන් ශාරීරිකව හා මානසිකව සුවපත් කරවන්නක් මෙන්ම සමගිය, අන්‍යෝන්‍ය විශ්වාසය, සුහදශීලීත්වය, ඉවසීම හා දරාගැනීමේ හැකියාවද වර්ධනය කරන්නකි. නමුත් දැන් අපේ ක්‍රීඩාව ඒවායෙනුත් පරාජය වෙමින් පවතී. එයට කදිම නිදසුන පසුගිය තරගාවලිය යි. තේරීම් කමිටුවේ සිට පුහුණුකරුවන්, ක්‍රීඩකයන් හා ප්‍රේක්ෂකයා දක්වා සියලු දෙනාම ක්‍රීඩාවේ මේ ගුණාංගවලින් පරාජය වී ඇති බව මොනවට පෙන්නුම් කළහ. දැන් ඇඟිල්ල දික්කරන්නේ මෙයින් කාට ද? පිරිසක් තේරීම් කමිටුවට සහ සභාපතිවරයාට ඇඟිල්ල දිගුකරන අතර තවත් පිරිසක් ක්‍රීඩකයන්ට ඇඟිල්ල දිගුකරයි. එකිනෙකාගේ වැරදි කියාගනියි. ප්‍රේක්ෂකයන් සමාජජාලවල ඇණකොටා ගනී. වරද කාගේ දැයි හරිහැටි හඳුනාගැනීමට නොහැකිව සියල්ලන්ම හතර අතේ දුවමින් සිටී.

එක් ප්‍රේක්ෂකයෙක් තම වේදනාව මුහුණු පොතේ ලියා තිබුණේ මෙසේ ය.

"සංස්කෘතියෙන්......? අපි පරාදයි..!
සදාචාරෙන්.....? අපි විනාශයි..!
පරිසරෙන්.....? අපි අනාථයි...!
හැමදේකින් ම අපි පරාදයි...!
අපි දිනුවෙ ක්‍රිකට්වලින් විතරයි...!
ඒකත් මෙහෙම වෙනකොට කොහොමද අපි ඉවසන් ඉන්නෙ බ්‍රෝ.....?"

ඇත්තටම අපි ක්‍රිකට්වලින් පමණක් නොව බොහෝ දෙයින් පරාද ය. නැත්නම් පරාදකොට ඇත. ඊට පිළිතුරු සෙවිය යුත්තේ තේරීම් කමිටුව වෙනස් කිරීමෙන් හෝ පුහුණු කරුවන් වෙනස් කිරීමෙන් හෝ ක්‍රීඩකයන් මාරු කිරීමෙන් පමණක් හෝ නොවේ. නිශ්චිත ප්‍රතිපත්ති හා ජාතික සැලසුම් මත ක්‍රිකට් ඇතුළු සියලු ක්‍රීඩාවන් නැවත නගාසිටවිය යුතුමය.





එසේම අප විසින් සලකා බැලිය යුතු තවත් කරුණක් වනුයේ ජයග්‍රහණ ගෙන එන බොහෝ දෙනා රටට ජාත්‍යන්තර පදක්කමක් ගෙන එන්නේ තම පුද්ගලික වෙහෙස මහන්සියෙන් හා කැපවීමෙන් පමණක් වීමයි. මෙම බොහෝ ක්‍රීඩකයින්ට රාජ්‍ය අනුග්‍රහය නොලැබේ. ඔවුන්ගේ තිබෙන ධෛර්යයසම්පන්න බවට රාජ්‍ය අනුග්‍රහය ලබාදී, පහසුකම් සලසා, හොඳ පුහුණුවකින් හා සූදානමකින් පසු තරගවලට ඉදිරිපත් වුවහොත් ඔවුන් ලෝකය තුළ ලංකාව ඉහළින්ම ඔසවා තබනවා නිසැක ය.

නමුත් ක්‍රීඩකයින් ඔසවා තබනවා වෙනුවට පාලකයින් කරන්නේ තමන්ගේ හා නෑදෑ හිතමිතුරන්ගේ ජීවිත ඔසවා තබා ගැනීමයි. සැලසුමකින් තොරව රටේ ජාතික ධනය නාස්ති කරමින් සංදර්ශන පැවැත්වීමයි.

සියල්ල මුදලට විකිණෙන, සියල්ල මුදල් මත තීරණය වන සමාජයක ක්‍රීඩාව විකිණීම, මුදලට යට වීම අරුමයක් නොවන්නේ ය. එහෙයින් වෙනස් කළ යුතුවන්නේ මේ නරුම සමාජ ක්‍රමයයි. එවිට ක්‍රිකට් ක්‍රීඩාවෙන් පමණක් නොව අප පරාජය වී ඇති බොහෝ දෙයින් අපට ජයග්‍රහණ භුක්ති විඳීමට හැකි වන්නේ ය.

## වේගවත් මිනිසා බෝල්ට්

ඔහු නමින් උසේන් බෝල්ට් ය. 1986 අගෝස්තු 21 ජැමෙයිකාවේ දී උපත ලද මොහු මලල ක්‍රීඩා පිටියෙන් ඔබ්බට ලොවපුරා ක්‍රීඩාලෝලී හදවත් දිනූ ක්‍රීඩකයෙකි. පාසැල් අවධියේ සිටම සිය දක්ෂතා දිගහළ මොහු වයස අවුරුදු 14දී උසස් පාසැල් ශූරතා තරගාවලියේ දී මීටර 200 ඉසව්ව සඳහා රිදී පදක්කමක් දිනාගත්තේ ය. 2002 දී ජැමෙයිකාවේ කින්ස්ටන්හි පැවති ලෝක කනිෂ්ඨ ශූරතාවලියේ මීටර 200 ඉසව්ව ජයලබමින් ලොව ලාබාලතම කනිෂ්ඨ ඔලිම්පික්ලාභියා බවට පත්විය. මේ සමඟම ඔහු "විදුලි බෝල්ට්" නමින් ප්‍රචලිත විය.




බෝල්ට් ජැමෙයිකානු ඔලිම්පික් සංචිතයට තේරුණේ 2004 දීය. 2005-2006 වන විට ලොව ප්‍රමුඛතම ධාවන ශූරයන් පස්දෙනා අතරට ඔහු තේරී පත්විණ.

2008 චීනයේ බීජිං හි පැවති ඔලිම්පික් තරගයේ දීද ලෝක වාර්තා බිඳ දමමින් බෝල්ට් මීටර 100 ඉසව්ව තත්පර 9.69ක් තුළ නිමා කළේ ය. සිය ප්‍රථම රන් පදක්කම් ත්‍රිත්වය දිනාග ැනීමට බෝල්ට් සමත් වූයේ මීටර 100 හා මීටර 200 ඉසව් දෙක සඳහාම රන් පදක්කම් දිනාගත් ලොව ප්‍රථමයා බවට පත්වෙමිනි.

2012 ලන්ඩන් හි පැවති සමර් ඔලිම්පික් තරගාවලියේ දී තත්පර 9.63ක් තුළ තරගය නිමාකරමින් මීටර 100 සඳහා යළිත් වරක් ලෝක වාර්තාවක් තැබීමට ඔහු සමත් විය. එහිදී ද රන් පදක්කම් තුනක් ජයගත් බෝල්ට් ඔලිම්පික් තරගාවලියක දී ලෝක වාර්තා තුනක් බිහිකළ ලොව ප්‍රථමයා බවට පත්විය.

නව තරග ඉතිහාසයකට මග කියමින් මෙම අතිදක්ෂ ක්‍රීඩකයා 2016 රියෝ හීදී පැවැත්වූ ඔලිම්පික් තරගාවලියේ දී මීටර 100, මීටර 200, මීටර 4X100 ධාවන ඉසව් සඳහා තවත් රන් පදක්කම් ත්‍රිත්වයක් දිනාගැනීමට සමත් විය. එකපිට එක පැවති ඔලිම්පික් තරග ාවලි තුනක දී රන් පදක්කම් ත්‍රිත්වය බැගින් දිනාගැනීමට බෝල්ට් සමත්වූයේ සිය අග්‍රගන්‍ය කුසලතාව විදහාපාමිනි.

අවසාන ධාවන පිටියට සමුදීමට තීරණය කළ බෝල්ට් 2017 ලන්ඩන්හි පැවති ලෝක මලල ක්‍රීඩා ශූරතාවලියේ දී සිය අවසන් මීටර 100 තරගය සඳහා ලෝකඩ පදක්කමක් පමණක් වාර්තා කළේ ය. මීටර 4X100 තරගයේ දී පාදයේ ආබාධයක් හේතුවෙන් ඔහු පිටිය තුළ ඇද වැටුණේ ලොව දසත ප්‍රේක්ෂක හදවත් කම්පා කරවමිනි. නමුත් මුදල් අභිමුව කිසිවිටෙකත් ඇද නොවැටුණු මේ අග්‍රගන්‍ය ක්‍රීඩකයා සුන්දර මිනිසෙකු ලෙස ලොව ක්‍රීඩාලෝලී හදවත් තුළ රනින් සමරු තබා හමාර ය.

## නිහතමානී ශ්‍රී ලාංකිකයාගෙන් තවත් ජයග්‍රහණයක්




බෙල්ජියම් ස්පා ධාවන පථයේ ජූලි මස 16 පැවති මෝටර් රථ ධාවන තරඟ දෙකම ජයග්‍රහණය කිරීමට ඩිලන්ත මාලගමුවට හැකි විය. මෙම වර්ෂයේ අප්‍රේල් මස ඉතාලියේ පැවති තරඟයෙහි 2වන ස්ථානය ද, මාර්තු මස 4 වනදා ඩුබායි හි පැවති තරඟ දෙකෙන් පළමු හා තුන්වන ස්ථානද ලබා ගැනීමට ඔහු සමත් විය. එමෙන්ම 2016 වර්ෂයේ පැලැටිනම් එවොර්ඩ්ස් සම්මානයෙන් පිදුම්ලත් ජනප්‍රියම ක්‍රීඩකයා වූයේද ඔහුය.

මේ නිහතමානී ශ්‍රී ලාංකිකයා ජයග්‍රහණ තම පුද්ගලික ජයග්‍රහණ ලෙස නොසලකයි. එහි පූර්ණ ගරුත්වය සෑම මොහොතකම පිරිනමන්නේ ශ්‍රී ලාංකික ජනතාව වෙතය. මේ නිසාම මොහු සියලු ශ්‍රී ලාංකිකයින්ගේ හදවත් ස්පර්ශ කළ, කෙළින් කතා කිරීමට හැකි, කශේරුකාවක් සහිත ආදර්ශවත් ක්‍රීඩකයෙක් ලෙස ඉතා ඉහළින් සිටියි.

"බලාපොරොත්තු අත් නොහරින්න. කවදා හෝ අපේ මේ උතුම් රටේ අපට මීටත් වඩා සතුටෙන්, සාමයෙන් ජීවත් වෙන්න කාලයක් ඒවි. එය වෙනස් කළ හැක්කේ අපට පමණි. ධෛර්යයෙන් හා අවංකව කරන සියලු දේම ජයගත හැක." මේ ඔහුගේ ආදර්ශ පාඨයකි. අනාගත බලාපොරොත්තුවකි. ඔබට FORWARD අපේ ධෛර්යය හා ශක්තිය!

## සපත්තු කුට්ටමක් ගන්න පොල් කඩන ජාත්‍යන්තර පදක්කම්ලාභියා



ඒ.එම්.එස්. කුලසේන, හලාවත, දෙමටපිටිය, පුහුල්තේන ප්‍රදේශයේ පදිංචි වෘත්තියෙන් පොල් කඩන්නෙකි. 2016 වර්ෂයේ මෙරට පැවති ජාතික ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරගාවලිය නියෝජනය කළ ඔහු එම වසරේ බෘනායි පැවති ජාත්‍යන්තර ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරග ාවලියටද සහභාගී වී ඇත. එහි දී මීටර 800 හා 1500 ඉසව් සඳහා තෙවන ස්ථාන දිනාගත් ඔහු මීටර 5000 දුර දිවීමේ තරගයෙන් දෙවන ස්ථානය දිනාගැනීමට සමත් විය.

පසුගිය දා සිංගප්පූරුවේ පැවති ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරගාවලියට සහභාගී වී මීටර 800 හා 1500 තරගවලින් ජයගත් ඔහු මීටර 3000 බාධක දිවීමේ තරගයෙන් ද ජයග්‍රහණය කර ඇත.

පසුගියදා චීනයේ පැවැත්වූ ප්‍රවීණයන්ගේ මලල ක්‍රීඩා තරගාවලියට සහභාගී වීමට සපත්තු කුට්ටමක් නොමැති වීම නිසා තමන්ට හිමි වූ ත්‍යාග අලෙවි කිරීමෙන් මුදල් ලබාගැනීමට බලාපොරොත්තු වන බව කුලසේන මාධ්‍ය හමුවේ කියා සිටියේය.

ජාත්‍යන්තරය දිනූ ක්‍රීඩකයන්ගේ තත්වය මෙසේ නම් අපේ රටේ ක්‍රීඩාව වැටී ඇති තැන පැහැදිලිය. පාලකයින් හොරාකන තරමට, ජනතා මුදල් කාබාසිනියා කරන තරමට මෙවැනි ක්‍රීඩකයන්ට අනුග්‍රහය ලබාදීමට මුදල් නැතිනම් එය මුසාවකි, විහිලුවකි. මෙයයි අපේ රටේ ක්‍රීඩාවේ හා ක්‍රීඩා බලධාරීන්ගේ තරම!

# කවි නිම්නය

ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්

ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න. අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක් FORWARD කවි පිටුවේ වෙන්කරන්න. මෙන්න අපගේ ලිපිනය

*FORWARD කවිපිටුව, අංක 464/20, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.*

## නැගිටපන් සොයුර...

**අපායත්, දෙව්ලොවත්, ස්වර්ගයත්,**
**මවාගෙන අපේ උන් දණ නමා**
**වැඳ වැටෙන....**
**සෙනසුරුගේ, අඟහරුගේ,**
**හොයා යයි හෙට දවස**
**රොකට්වල පිටරට්ටු**
**උපහසින් සිනාසී,**
**තනන්නට ලැඟුම් හල්....**
**යදින අපේ ග්‍රහයන්ගේ**
**රාහුවෙක්, කේතුවෙක්**
**හමුනොවුනි මෙතෙක් කල්**
**කිසිඳු විද්වතෙකු හට....**
**කරුමේ යැයි වැඳගෙනම**
**පාවා දෙන්නේද වීරිය**
**නැගිටපන් සොයුර නුඹ**
**මනඃකල්පිත උන්ට බිය නැතිව...**

-----------------------------

තාරුකා ඒකනායක

## මිනිසෙක් හා දෙවියෙක්



හිඳී නම් මිහිපිට
වරම් ලත් දෙවියෙක්
දෙනු හැකිද වරමක්
සුමට කරනට
ඉරි තැළුණු ජීවිතය..
ඉඳින් හැකිනම්
සොයා දෙනු මැන
ගලට පණ දුන් මිනිසෙක්
නොව,
ගලෙන් පණ ලත් දෙවියෙක්...

හිරුමාලි දිසානායක

## රෙද්දෙ සිල් රෙදි

අහසට නැග්ගම
භූමිතෙල්
ඩිංගිකාරයෝ වැටුනා මහ පාරට
සහනාධාරයක්.....

උන්
ඇන්තනීට දුන්නා වෙඩි උණ්ඩ
පපුව මැදට.....

වැලිකඩ හිටියේ හිරකාරයෝ නිසා
මිනිස් ලේ වලින්
මහපොළව
රතුපස් වළක් උනා......

රොෂේන්......!!
මං ගොඩක් හෙව්වා
මහපාරේ
යක්ෂයාගේ වධකයින් වටකර ගත්
උඹේ ෆොටෝ එක.....

නෑ
එහෙම එකක් නෑ
හැමතැනම තිබුණේ සිල් රෙදි......

මිලියන හයසිය අසූවක
උන්
සිල් රෙදි බෙදලා උපාසක අම්මලාට
උන්ට හැංගෙන්න
ඡන්දෙට.....

ඔව්
උන්ගේ රෙද්දේ සිල් රෙදි.....!!

*FB ඇසුරෙන්*

## සොයුරු සොයුරියණි අප..

අමාවක නොවූ රැය
සැඟව ගිය සඳක් ගැන
ගී ගයන විහඟුන්ය
සොයුරු සොයුරියණි අප..

කපා බිම හෙළූ අතු
කැබලි සිටුවමින් තව
සෙවණ දෙන මහ ගහක්
පතන උන් වෙමුය අප..

සිංහලේ මරක්කලේ
දමිළ ලේ එකම ලේ
බව කියා කෑ ගහන
මිනිසුන් ම තනන අප..

වෙනුර ත්‍රිමාලා එක්ක
නිෂ්මි බාලෙලා රැඳුණ
ශාන්ත බණ්ඩාරලා හැදූ
පරපුරේ උන් ය අප..

යුක්තිගරු දේශයක
සාධාරණ සමාජයක
නිවහල්ම උන් පතන
නිවහල්ම උන් තනන..

දිනූෂ පරණවිතාන

## අක්කා

රූම් එකේ දොර ඇරලා දෙන වෙලාවේ
මං අඳුරගත්තා පටිය කැඩුණු සෙරෙප්පුව
දැණුනා ත්‍රිපෝෂ සුවඳ
මූණ බැලුවෙ නෑ මං
යතුර වැටුණා මා අතින්
කස්ටමර් කෑ ගැහුවා
ඉක්මන් කරපං කොල්ලෝ කියලා

අල්ලපු කාමරේ ඉඳං
හිල්වලින් බලන ගමං
වීරෙලා කියනවා ඇහුණා
බඩේ ළමයෙක් හම්බ වෙච්ච ඉරි තිබ්බට
ඒකි පුරුදුකාරියෙක් නොවන වග

මට මතක් වුණා
අම්මා නාවන්න
පොඩි එකාට බෙහෙත් පොවන්න
මස්සිනාගේ මූත්‍රා බටේ ගලවන්න
ඒකිට තිබ්බ පුරුද්ද

ත්‍රීවීල් - එක ගියාට පස්සේ
ඇඳ අස් කරන්න කලින්
කොට්ටවල තිබ්බ කඳුළු වේලෙන කං
ෆෑන් එක වැඩි කරලා මං
එළියට බැහැලා
ඔහේ ඇවිදගෙන ගියා ටික දුරක්

මහින්ද ප්‍රසාද් මස්ඉඹුල

## නීතිය

ලොකු සතුන්
ගැටෙන විට
කැඩෙන




පොඩි සතුන්
වැදෙන විට
හිර වෙන

අමුතු
මකුළු දැල



# අපේ රටේ තරුණයා මේ සමාජයේ සිදුවන වැරදි දේට එරෙහි විය යුතුයි

**රංගන ක්ෂේත්‍රයේ ජනප්‍රිය රංගන ශිල්පියෙකු ලෙස තුසිත ලක්නාත් හඳුන්වන්න පුළුවන්. ඔහු වේදිකා හා ටෙලි නාට්‍ය නළුවකු වන අතරම කැළණි විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු ලෙස සේවය කරයි. මේ forward ඔහු සමඟ කළ කතා බහ.**

> **ලෝකයටම බලපාන සමාජ දර්ශනයක් ලෙස මා දකින්නෙ සමාජවාදය පමණයි.**

### ඔබව හඳුන්වා දෙනවට කැමති කොහොමද?

ඇත්තටම වැඩි පිරිසක් මාව දන්නේ, වේදිකා නාට්‍ය හා ටෙලි නාට්‍ය නළුවෙකු ලෙසයි. නමුත් මම විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයෙකු ලෙසත් සේවය කරනවා. මම හිතන්නේ මගේ ප්‍රධාන කාර්යය, මගේ රස්සාව ඒක. විවිධ භූමිකාවන් රැසකට පණ පොවමින් හිටියත් මම සාමන්‍ය මනුස්සයෙක්. ඒකට මම වඩාත්ම කැමතියි.

### මෙතෙක් ඔබ ආ ගමන් මඟ ගැන කෙටියෙන් කිවුවොත් ?

උසස් පෙළ අවසන්ව 2002 දි ටවර් හෝල් නාට්‍ය පාසලට ඇතුළත් වීමෙන් පසුව නාට්‍යකරණයට පිවිසෙනවා. එතැනින් තමයි මගේ රංගන ජීවිතය ආරම්භ වෙන්නේ. ඊට පස්සේ වේදිකා නාට්‍යය කිපයකම වේදිකා පරිපාලකයෙකු ලෙස කටයුතු කළා. ඒ වගේම රංගනයෙන් දායක වුණා. සම්මාන කිහිපයකුත් ලැබුණා. ඉන් පස්සේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙනවා. උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසුව එහි ඉගැන්වීම් කටයුතු ආරම්භ කළා. ඒ වගේම මම මේ වන විට කැලණිය විශ්වවිද්‍යාලයේත් ඉගැන්වීම් කටයුතු සිදු කරමින් ඉන්නවා. ඊට අමතරව වේදිකා නාට්‍ය ගණනාවකට රංගනයෙන් දායක වෙලා තියෙනවා. වේදිකා නාට්‍ය පිටපත් ගණනාවක් රචනා කර තියෙනවා. ඒ වගේම ටෙලිනාට්‍ය ගණනාවකටත් චිත්‍රපට ගණනාවකටත් රංගනයෙන් දායක වී තිබෙනවා.

### කලා ජීවිතයේ ඔබ ලබාගත් ජයග්‍රහණ ගැන සඳහන් කළොත්?

සම්මාන ජයග්‍රහණ ලෙස දකින්න මම කැමති නැහැ. මට රාජ්‍ය නාට්‍ය උළෙලේ සහ යෞවන සම්මාන උළෙලේ සම්මාන ගණනාවක් ලැබුණා. නළුවෙක් ලෙස, අධ්‍යක්ෂවරයෙකු ලෙස සහ පිටපත් රචකයෙක් විදියට 2007 රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නළුවා සම්මානය ලැබුණා. ඊට පස්සේ 2009, 2014, 15, 16 වසරවලදීත් සම්මාන හිමිවුණා. 2014 දී හොඳම නළුවා, හොඳම පිටපත 1,2, හොඳම අධ්‍යක්ෂණය, හොඳම පසුතල නිර්මාණය කියන සම්මාන ටික ඔක්කොම හම්බ වුණා. කොහොම වුනත් මම නැවතත් කියන්නේ සම්මාන ලැබීම ජයග්‍රහණ ලෙස දකිනවට මම විරුද්ධයි.

### කලාකරුවෙකුට සම්මානයක් ලැබීම ඉදිරි නිර්මාණ කටයුතුවලට උදවුවක් නොවෙයිද?

කලාකරුවෙකුට සම්මානයක් ලැබීම නිර්මාණකරනයට ලොකු උදවුක් ලෙස මම දකින්නේ නැහැ. නමුත් මුල්කාලීනව මේ ක්ෂේත්‍රයේදී කෙනෙකුට නිර්මාණයක් කිරීමට එයින් යම් උත්තේජනයක් සැපයෙනවා කියලා කියන්න පුළුවන්. විශේෂයෙන්ම කල්පනා කරලා බැලුවොත් රාජ්‍ය සම්මාන උළෙල කියන්නේ රජය, තමන් කලාවට අතදෙනවා, උදවුකරනවා කියන එක පෙන්වීම සඳහා පවත්වන්නක් පමණයි. එයින් කලාවට හෝ කලා නිර්මාණවලට විශාල උදවුවක් ලැබෙන්නෙ නෑ. එහෙම විශාල දෙයක් කෙරෙනවානම් මේ දීලා තියෙන සම්මාන ප්‍රමාණයට අද වෙනකොට කලා ක්ෂේත්‍රය ගොඩක් ඉහළ තැනක තියෙන්න ඕන. නමුත් එහෙම වේලා නෑනෙ.

### සමාජ මතයක් ගොඩනැගීමේදි කලාව කොහොමද වැදගත් වෙන්නේ?

මට අදාළව නාට්‍ය ක්ෂේත්‍රය ගැන කියනවානම් වර්තමානයේදී මතවාදයක් ගොඩනැගීම වෙනුවෙන් කලා නිර්මාණ කෙරෙන්නෙ නැති තරම්. දැන් හදමින් ඉන්නේ ෂෝස් (shows) දුවන්න පුළුවන් කලා භාණ්ඩ පමණයි. කොහු ඉදල් හදනවා වගේ තවත් භාණ්ඩ හැදීමක් තමයි දැන් කරමින් තියෙන්නේ. ඇත්තම කිව්වොත් හෝල් එකට නාට්‍ය කරන එක තමයි අපි කරන්නේ. එහෙම නැතුව මිනිසුන් ඥානනය කිරීම වගේ දෙයක් ඒ තුළ කෙරෙන්නේ නෑ. නාට්‍යකරුවෝ, නාට්‍ය ශාලාවට මිනිස්සු ගෙන්වාගන්නේ කොහොමද කියන එක හිතලයි නිර්මාණ කරන්නේ. මිනිස්සුන්ට මිලක් නියම කරන එකයි අපි කරන්නේ. මම හිතන්නෙ නෑ, මේ මිලත් එක්ක කරන විකුණුම් ක්‍රියාවලිය ඇතුළෙදි මතවාදයක් ගොඩනැගීම වෙනුවෙන් කලා නිර්මාණයන් යොදාගන්න පුළුවන් කියලා. මේ වෙලාවෙ ඇත්තම අප ප්‍රශ්න කළ යුතුයි, කලාවෙන් අපි මොකක්ද කරන්නෙ කියලා. මම ඉගෙනගත්ත දෙයින් හරි ලබපු අත්දැකීම්වලින් හරි මගේ ආර්ට්ස්(Arts) දැනුමෙන් හරි මම මේ සමාජයට මොකක්ද කරන්නේ කියලා මං නැවත හිතමින් ඉන්නවා.

අපේ රටේ බොහෝ කලාකරුවෝ කරපු දේ තමයි, අවු. 50ක් තිස්සේ යූ.එන්.පී. එක හෝ ශ්‍රී ලංකා එක වෙනුවෙන් පෙනී ඉඳල ඒ වෙනුවෙන් තමන්ට යමක් කරයි කියලා බලාපොරොත්තු වුණු එක. එකකට බලය දීලා ඒකෙන් යමක් නොලැබුනාම අනෙක වෙනුවෙන් පෙනී ඉන්න එකයි කළේ. ඔය කියන පක්ෂ දෙකම එකම විදියකට වැඩකරපු පක්ෂ දෙකක් මිස දෙවිදියකට වැඩකරපු පක්ෂ නෙවෙයි. ඒ නිසා මම දකින්නේ, පරණ පාලක පංතිය විවේචනය නොකරන කලාවකින් ඇති වැඩක් නෑ කියන එකයි.

### අපේ රටේ පොදු තරුණයා මුහුණ දෙන අභියෝග ගැන ඔබට තිබෙන්නේ මොනවගේ හැඟීමක්ද?

මේ වෙනකොට තරුණ අය මුහුණ දෙන ප්‍රධානතම අභියෝග යක් තමයි මත්ද්‍රව්‍ය. මම රට පුරා යන කෙනෙක්. පාසල් ගණනාවක වැඩවලට සම්බන්ධ වෙලා අත්දැකීම් තිබෙනවා. 8-9 පංතිවල දරුවෝ පවා මේවාට අබ්බැහි වෙලා. එය වසංගතයක් ලෙස සමාජය වෙළා ගනිමින් තිබෙනවා.



ඇත්තටම ගත්තොත් රටට මේවා ගේන්න මැදිහත් වෙන්නේ දේශපාලඥයින් හා ඔවුන්ගෙ ළඟම හිතවතුන්, ඒ වගේම අනෙක් අභියෝගය තමයි ආගම්වාදය. එය සමාජයට ඉතා නරක බලපෑමක් කරමිනුයි තිබෙන්නේ. Facebook වල පවා ඉතාමත් පහත් විදිහට අනෙකාව හෙළා දකිනවා. එහෙම කොහොමද වෙන්නෙ? මගේ ආගම විතරක් කොහොමද හරි වෙන්නේ; අනෙකාගේ ආගමට වඩා ලොකු වෙන්නේ? ඒ වගේම තරුණ පිරිස් ගත්තම විශේෂයෙන් විශ්වවිද්‍යාල සිසුන් පවා රැකියා කේන්ද්‍ර කරගෙන දැනුම සොයනවා ඇරුණු කොට තමන්ගෙ පැවැත්ම වෙනස් කරගැනීම සඳහා දැනුම සොයනවාද කියන ප්‍රශ්නය තියෙනවා. විශ්වවිද්‍යාල හරහා තරුණයා ජොබ් මාකට් එකකට යවනවා ඇරෙන්න කෙරෙන වෙන යමක් නෑ. මම කියන්නේ මේ මොහොතේ තරුණයාට මීට වඩා සමාජ වගකීමක් තියෙනවා. ඔවුන් මේ සමාජයේ සිදුවන වැරදි දේට එරෙහි විය යුතුයි කියන එකයි මා දකින්නෙ. එසේ නොවීම ගැන මා ඇතුළු තරුණ පරම්පරාවට මට විවේචනයක් තිබෙනවා.

### "FORWARD" තරුණය ඉලක්ක කරගත් පුවත්පතක්. මෙවැනි මාධ්‍යක අවශ්‍යතාවය ගැන ඔබට දැනෙන්නේ කොහොමද?

මාධ්‍ය ආයතන අතර තියෙන තරඟය තුළ අනෙකා අභිබවා යෑම තමයි හැම එකකම අරමුණ. ඒ අනුව තමයි ප්‍රවෘත්ති වාර්තාකරණය සිද්ධ වෙන්නෙ. අපේ වැනි සමාජයක News කියන්නේ තවදුරටත් බඩු භාණ්ඩ තමයි. හැමෝම කල්පනා කරන්නේ කොහොමද තමන්ගෙ බඩු වැඩිපුර විකුණගන්නේ කියලා. ඒ නිසා නිවැරදි තොරතුරු ගලායෑමක් සිදුවෙන්නේ නෑ. මාධ්‍යය තමන්ට අනුග්‍රහය දක්වන කෙනා වෙනුවෙන් තමයි පෙනීසිටින්නේ. අයිතිකාරයාගේ අරමුණ වෙනුවෙන් තමයි මාධ්‍ය හැසිරවෙන්නේ. ඇත්තම තත්වය ඒකයි.

> **සමාජයක NEWS කියන්නෙ තවදුරටත් බඩු භාණ්ඩ, හැම මාධ්‍යක්ම උත්සාහ කරන්නෙ තමන්ගෙ බඩු වැඩිපුර විකුණ ගන්නයි....**

ලෝකයටම බලපාන සමාජ දර්ශනයක් ලෙස මා දකින්නේ සමාජවාදය පමණයි. සමාජයට මතවාදී බලපෑමක් කළ හැක්කේ දේශපාලන දර්ශනයකට පමණක් කියලයි මම දකින්නේ. මා සමාජවාදය විශ්වාස කරනවා. ඒ හරහා පමණයි සමාජය තුළ කථිකාවක් ගොඩනැගිය හැක්කේ. ඒ සම්බන්ධයෙන් යම් සුභවාදයක් මට තියෙනවා. මේ මොහොතේ එවන් දර්ශනයක් සහිතව අනෙකා සමග කථිකාවක් ගොඩනැගිය යුතුයි කියලා මං හිතනවා. ඒ වගේම මම ඔබේ කාර්යයට සුබපතනවා. එය මේ වෙලාවේ කළයුතු යුතුකමක් ලෙස මම දකිනවා.

## ජාති, ආගම් පරයා නැගුණු මිනිස්කම

මෙවර ස්වර්ණපුස්තක සම්මානයෙන් පිදුම් ලද නිශ්ශංක විජේමාන්නයන්ගේ කෙටි නවකථාව "හඳ පළුව තනි තරුව"යි. එය එක් පැත්තකින් වෙනස් සමාජ සංස්කෘතීන් දෙකක් එකට මුහුවීමට වෙරදරන සමාජ පසුබිමක ජාතිවාදය විසින් එකී ජන ජීවිතවලට සිදුකරනු ලබන බලපෑම විදහාලයි. ඒ ''අනිල්'' නම් වූ ජාතිය නොහඳුනන තරුණ ගුරුවරයාගේ චරිතය හරහා තාරුණ්‍යයට, ආදරයට, විවාහයට ලාංකීය සමාජ ආර්ථික පසුබිම විසින් සිදුකරන්නා වූ බලපෑම මනාවට ගෙනහැර පාමින්ය.



පාඨක මනසේ ආනන්දය මතුකොට ප්‍රඥාව දෙසට විහිදුවාහරින චිත්ත රූප පෙළක් එක දිගට මවාලීට කතුවරයා සමත්ව ඇත්තේ සිත්ගන්නා සුළු අයුරින්ය. එක් පසකින් දූ දරු පරම්පරාවේ යෞවන ප්‍රේමයත් අනෙක් පසින් සමාජ අර්ථික බැදීම්වලින් වෙන්කරන ලද දෙමාපිය පරම්පරාවේ ආදරයත් එකිනෙකට හමුනොවන අයුරින් කතාව පුරාවට කුතුහලය තීව්‍ර කරමින් ඇත්තේය.

කෘතිය පුරාවට පවතින සංකේත සහ නාට්‍යමය ස්වභාවයත්, කුතුහලයත් තුළින් කථා රසය නිරන්තරයෙන්ම උද්දීපනය කරයි. සමාජ, සංස්කෘතික, ආගමික හා දේශපාලනික පැතිකඩයන් ඔස්සේ මනුෂ්‍යත්වය විනිවිදින කතුවරයා සෑම සිදුවීමක්ම පාඨක මනසට දැඩිව දැනෙන ලෙස ඉදිරිපත් කරයි.

ආගමික, සංස්කෘතික බෙදීම් විසින් මනුෂ්‍යත්වය රිදවන ආකාරය ඉතා විශිෂ්ට ලෙස ගෙනහැර පාන කතුවරයා මෙම කෘතිය තුළින් ජාතිය, ආගම, කුලය, භාෂාව යන කිසිවකට මනුෂ්‍යත්වය පැරදවිය නොහැකි බව අපට පසක් කරයි.


# 19 වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලට එක්වීමට SYU සූදානම්!

එළැඹෙන ඔක්තෝම්බර් මස 14 සිට 22 දින දක්වා රුසියාවේ සෝචි නුවරදී පැවැත්වීමට නියමිත 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙලහි සූදානම් කිරීමේ කටයුතු අවසන් අදියරට පැමිණ තිබේ. මෙය ලෝකය පුරා වෙසෙන අධිරාජ්‍යවිරෝධී, ප්‍රගතිශීලී සහ වාමාංශික තරුණ හා ශිෂ්‍යයන් එකට එකතු වන ලොව විශාලතම තරුණ හා ශිෂ්‍ය උළෙල ද වේ.

මෙවර තරුණ හා ශිෂ්‍ය උළෙල සඳහා ලෝකය පුරා රටවල් 150කින් තරුණ හා ශිෂ්‍ය සංවිධාන හා විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරමින් 20000කට වැඩි පිරිසක් සහභාගී වීමට නියමිතය. මෙය ලොව පුරා විසිර සිටින අධිරාජ්‍යවිරෝධී, ප්‍රගතිශීලී තරුණ හා ශිෂ්‍ය ප්‍රජාවට ඒකරාශී වීමට, සිය අත්දැකීම් බෙදා ගැනීමට, දැනුම සහ අවබෝධය වර්ධනය කර ගැනීමට, ලොව පුරා සහෝදර සංවිධානවල අත්දැකීම්වලින් පන්නරය ලබාගැනීමට, ගෝලීය වශයෙන් අධිරාජ්‍යවිරෝධී අරගලයේ ප්‍රවණතා අවබෝධ කර ගැනීමට, ජත්‍යන්තර සහයෝගීතාවය, මිත්‍රත්වය හා විශ්වාසය වර්ධනය කර ගැනීමට, ඒ තුළින් අරගලය ශක්තිමත් කර ගැනීමට හා කාලීන ගෝලීය ප්‍රවණතා පිළිබඳ පුළුල් සාකච්ඡා ඇතිකර ගැනීමට ඉඩ සලසන අවස්ථාවක් වෙයි.

මෙවර උළෙලේ තේමාව වනුයේ "සාමය, සහයෝගීතාවය සහ සමාජ සාධාරණත්වය උදෙසා අධිරාජ්‍යවාදයට එරෙහිව අප අරගල කරන්නෙමු! යන්නයි. රුසියාව විසින් මෙහි සත්කාරකත්වය දරන්නේ ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවයේ සියවස් සැමරුමද පදනම් කරගෙනයි. ඒ නිසාම මෙවර උළෙලට සහභාගී වීමට ලොව පුරා තරුණ හා ශිෂ්‍යයින්ගේ විශාල උනන්දුවක් හා උද්යෝගයක් ඇති වී තිබේ.

ශ්‍රී ලංකාවද රටක් වශයෙන් මෙම උළෙල සඳහා විශාල තරුණ හා ශිෂ්‍ය පිරිසක් සම්බන්ධ




කිරීමට සූදානමින් සිටින අතර සමාජවාදී තරුණ සංගමය හා සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් 30කට වැඩි පිරිසක් සහභාගී වීමට නියමිතය. උළෙල ඉතිහාසය තුළ උළෙලක් සඳහා අප පක්ෂයෙන් වැඩිම පිරිසක් සම්බන්ධ වන්නේද මෙම අවස්ථාවේදීයි.

ඊට අමතරව WFDY හි ආසියානු කලාපය සඳහා වූ උප සභාපති ධූරය දරමින් හා රුසියාවේ හිඳිමින් ජාත්‍යන්තර සංවිධාන කමිටුවේ (IOC) වැඩ කටයුතු කරමින් වෛද්‍ය ලසන්ත අබේවර්ණ සහෝදරයා හා පුබුදු සමරවීර සහෝදරයා විසින් කරන මැදිහත්වීම් හේතුවෙන් සමාජවාදී තරුණ සංගමය, ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය (WFDY) තුළ සංවිධානමය වශයෙන් දැවැන්ත තහවුරුවක් අත්පත් කරගෙන ඇත්තෙමු. එය අප ලැබූ විශාල ජයග්‍රහණයකි. එය අපට සංවිධානයක් ලෙස දැවැන්ත අත්දැකීම් සම්භාරයක් එකතුකර ගැනීමට ලැබුණු සුවිශාල අවස්ථාවකි.

මෙවර උළලේදී අධිරාජ්‍යවාදය විසින් ඇති කරන ලද සරණාගත අර්බුදය, ලෝක සාමය සඳහා ජාත්‍යන්තර සහෝදරත්වයේ වැදගත්කම, ජාතිවාදයට, පැසිස්ට්වාදයට හා කොමියුනිස්ට් විරෝධයට එරෙහිව කරන අරගලයේ වැදගත්කම, නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය දිනාගැනීම හා රැකගැනීම, නව විද්‍යා, තාක්ෂණ හා සංස්කෘතික දැනුම වෙත නිදහස් පිවිසුම දිනාගැනීමේ අරගලය සඳහා ශිෂ්‍ය ව්‍යාපාරයේ කාර්යභාරය, ධනේශ්වර අර්බුදය හේතුවෙන් පැන නැගී ඇති විරැකියාව හා තාරුණ්‍යයේ අස්ථාවර බව, ඉහළ යමින් පවතින පාරිසරික ගැටලු යනා දී තේමාවන් ඔස්සේ විවිධ වැඩසටහන් සංවිධානය වනු ඇත. ඊට අමතරව ක්‍රීඩා වැඩසටහන් මෙන්ම උළෙල ආරම්භයේ දී ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් විප්ලවයේ සියවස් සමරුව වෙනුවෙන් ද වැඩසටහන් සම්පාදනය වනු ඇත. එබැවින් සමාජවාදී තරුණ සංගමය ලෙස අප 19 වැනි ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල මහත් ඉහළින් සාර්ථක වේවා යැයි ප්‍රාර්ථනා කරන්නෙමු!

# ඇමරිකා එක්සත් ජනපදය අඩියක් පස්සට තියයි

වඩාත් සාධාරණ කොන්දේසි ප්‍රමාණයක් ගොඩනගාගත හැකි නම් දේශගුණික විපර්යාස පාලනය කිරීම සඳහා ඇතිකර ගනු ලැබූ " පැරිස් සම්මුතිය" තුළ රැඳී සිටීමට තමන් සූදානම් බව එක්සත් ජනපද රාජ්‍ය ලේකම් රෙක්ස් ටිලර්සන් විසින් ප්‍රකාශ කර ඇතැයි වාර්තා වේ.

දේශගුණික විපර්යාසයන් පාලනය කිරීම, පරිසරයට මුදාහරින විෂවායූන් සීමාසහිත කිරීම වෙනුවෙන් ලොව බලවත්ම රාජ්‍යයන් සියල්ල ඒකාබද්ධ වී ඇති කරගනු ලැබූ පැරිස් සම්මුතිය තුළින් වායු ගෝලයට මුදා හරිනු ලබන කාබන් වායුව සීමා කිරීමට යෝජනා කෙරුණි. මේ අතර ඇමරිකා එක්සත් ජනපදය එම සම්මුතියෙන් ඉවත් වන බව පසුගිය ජුනි මාසයේදී ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ



කරනු ලැබීය.

පරිසර උෂ්ණත්වය ඉහළ යෑමට බලපාන කාබන් ඇතුළු විෂවායූන් වායුගෝලයට මුදාහරින ප්‍රධානම රට බවට ඇමෙරිකා එක්සත් ජනපදය පත්ව ඇති තත්වයක් තුළ ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ ස්ථාවරයට ලොව අනෙකුත් රටවල විරෝධය එල්ලවිය. එකී විරෝධය හමුවේ මෙලෙස සිය ස්ථාවරය වෙනස් කරගැනීමට සූදානම් බව එක්සත් ජනපදය විසින් ප්‍රකාශ කර තිබේ.

විශේෂයෙන්ම ඉර්මා සුළි කුණාටුවෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරීඩා ප්‍රාන්තයට දැවැන්ත විනාශයක් සිදුව තිබුණි. එවැනි සුළි කුණාටු වර්ධනය වීමට ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම සෘජුවම බලපා ඇති බව හෙළිදරව් වීම හේතුවෙන් එක්සත් ජනපදයේ ස්ථාවරය වෙනස් වීමට බලපෑම් කර ඇතැයි පරිසර සංවිධාන අනුමාන කරයි.

එමෙන්ම පැරිස් සම්මුතියෙන් ඉවත් වීමට ඇමරිකා එක්සත් ජනපදය තීරණය කිරීම සම්බන්ධයෙන් බොලීවියානු ජනාධිපති ඊවෝ මොරාලේස් විසින් පසුගිය දා එක්සත් ජනපද ජනාධිපති ඩොනල් ට්‍රම්ප්ට එරෙහිව දැඩි විවේචනයක් එල්ල කර තිබූ අතර ස්වභාවික විපත් යනු ධනවාදයේ තවත් එක් නිෂ්පාදනයක් යැයිද බොලීවියානු ජනාධිපතිවරයා ප්‍රකාශ කර තිබිණි.

# පෙරපාසල්වල සිට සමාජවාදී ආචාර ධර්ම ඉගැන්වීමට චීනයේ නව වැඩපිළිවෙළක්



මහජන චීනය ආරම්භ කර ඇති සමාජවාදී ආචාර් ධර්ම වර්ධනය කිරීමේ අධ්‍යාපන කටයුතු සඳහා මේ වනවිට නව වැඩපිළිවෙළක් හඳුන්වා දී ඇති බව වාර්තා වේ.

ඒ අනුව 2018 වසර වන විට බීජිංවලදී පෙරපාසල්, ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල ඉගැන්වීම් කටයුතු කරන සියලුම ගුරුවරුන්ට සමාජවාදී ආචාරධර්ම පිළිබඳ පුහුණු පාඨමාලා සම්පූර්ණ කර අවසන් කිරීමට චීනය සැලසුම් කර තිබේ.

මෙම වැඩපිළිවෙළ 2012 වසරේ පැවති චීන කොමියුනිස්ට් පක්ෂයේ 18වන ජාතික සම්මේලනයේදී සකස් කර ඇති අතර 2015 සිට මෙම ආචාර ධර්ම පිළිබඳව පාසල්වල ඉගැන්වීම ආරම්භ කර ඇත.

එහි සෞභාග්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය, ශිෂ්ටත්වය, සමගිය, නිදහස, සමානාත්මතාවය, සාධාරණය, නීතිය, දේශප්‍රේමීත්වය, කැපවීම, අවංකකම සහ මිත්‍රත්වය ආදී ලෙස ආචාර ධර්ම 12ක් අඩංගු වන අතර එම පාඨමාලාව චීනයේ භාවිතා කරනු ලබන භාෂා 24කින් ප්‍රකාශයට පත් කිරීමට මේ වන විටත් මහජන චීනය කටයුතු කර තිබේ.

# කැමති ආගමක කැමති පුරුෂයෙක් හා විවාහ වීමට ටියුනීසියානු කාන්තාවන්ට ඉඩ



ලොව පුරා බොහෝ මුස්ලිම් රාජ්‍යයන් හි ඉස්ලාම් භක්තිකයින්ට අන්‍යාගමිකයෙකු හා අවාහ විවාහ වීම නීතියෙන් සපුරා තහනම් වන නමුත් උතුරු අප්‍රිකානු රටක් වන ටියුනීසියාව එම තහනම ව්‍යවස්ථාවෙන් ඉවත් කරගෙන තිබේ.

ඕනෑම ආගමක තමන් කැමති පුරුෂයෙකු හා විවාහ වීමට ඉඩ ලබාදෙන ලෙස, මෙම නීතියට අභියෝග කරමින් ටියුනීසියානු කාන්තාවන් දිගින් දිගටම අරගල කළහ. එසේම මෙම ගල් යුගයේ නීති රීති ප්‍රතිසංශෝධනය කළ යුතු බවටද වසර ගණනාවක් තිස්සේ හඬ නැගූහ. එහි ප්‍රතිඵලයක් ලෙස එරට ජනපති බෙජි කායිඩ් එස්සෙබ්සි විසින් එම නීතිය ව්‍යවස්ථාවෙන් ඉවත් කරගෙන ඇත.

# වෙනිසියුලාව වෙනුවෙන් විපක්ෂය සමඟ නව සාකච්ඡා වටයකට මදුරෝ සැරසෙයි



රටේ දේශපාලන අර්බුදය ජයගැනීම සඳහා විපක්ෂය සමඟ නව වටයක සාකච්ඡාවක් ආරම්භ කිරීමට වෙනිසියුලානු ජනාධිපති නිකොලස් මදුරෝ විසින් එකඟතාවය පළ කර ඇති බව වාර්තා වේ.
ඒ සඳහා මදුරෝ වෙත ආරාධනා කරනු ලැබ ඇත්තේ හිටපු ස්පාඤ්ඤ අගමැති ජෝස් ලුයි සැපටෙරෝ සහ ඩොමිනිකානු ජනාධිපති ඩැනිලෝ මෙඩිනා විසිනි.

# අධ්‍යාපනය වෙනුවෙන් කොස්ටාරිකා සිසුන් පාරට




උසස් අධ්‍යාපනය සඳහා රජය වියදම් කරන මුදල් ප්‍රතිශතය ඉහළ දමන ලෙස ආණ්ඩුවට බලකරමින් කොස්ටාරිකා රාජ්‍යයේ සිසුන් විරෝධතා ආරම්භ කර තිබේ.
දැනට කොස්ටාරිකා රාජ්‍යය උසස් අධ්‍යාපනය සඳහා වෙන්කර ඇත්තේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.37%ක ප්‍රතිශතයක් පමණි. ඒ අනුව එහි විශ්වවිද්‍යාල සිසුන් පවසන්නේ එරට 2018 සඳහා අයවැයේදී එම ප්‍රතිශතය 1.5%ක් දක්වා වැඩි කළ යුතුබවයි. ඔවුහු මේ පිළිබඳව එරට මන්ත්‍රී මණ්ඩල සාමාජිකයින්ටද බලකරමින් සිටිති.

# විශ්වය බිහිවීම පිළිබඳ විද්‍යාත්මක කියවීමක්

අද වන විට අප ජීවත් වන ලෝකයේ විද්‍යාව හා තාක්ෂණය සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින අතර මෙතෙක් කල් අනාවරණය නොකරගෙන තිබූ භෞතික ලෝකයේ රහස් අනාවරණය කර ගනිමින් තිබේ. අතීතයේ සොබාදහම හමුවේ අසරණ වූ මිනිසා සොබාදහමේ සිදුවන සංසිද්ධීන් විග්‍රහ කරගැනීමට අසමත් විය. සොබාදහමේ සිදුවන සංසිද්ධි විග්‍රහ කරගැනීමට අසමත් වූවා පමණක් නොව ඒවාට දේවත්වයක් ආරෝපණය කිරීමද සිදුවිය. ආගමික මතවාද මේ නිසා බිහිවන්නට විය. සොබාදහමේ සංසිද්ධීන් විග්‍රහ කරගැනීමට නොහැකි වූවා මෙන්ම ඒවා දේවත්වයෙන් සලකා කටයුතු කරන්නටද විය. ඒ නිසා ලෝකයේ සිදු වූ පරිණාම ක්‍රියාවලිය පිළිබඳ අවිද්‍යාත්මක මතවාද සමාජගත වන්නට විය. නමුත් විද්‍යාවේ දියුණුවත් සමඟ විශ්වයේ බිහිවීම පිළිබඳ තිබූ අවිද්‍යාත්මක මතවාදයන් රාශියක් නිෂ්ප්‍රභා කර තිබේ. එහෙත් තවදුරටත් විද්‍යාවේ දියුණුව තුළින් සංවර්ධනය කරගත යුතු බොහෝ දේද තිබේ. එසේම සොබාදහම තේරුම් ගැනීමට නොහැකි වූ මිනිසා විසින් විශ්වයේ බිහිවීම සම්බන්ධයෙන් ගෙතූ අවිද්‍යාත්මක මතවාදයන් තවමත් සමාජයේ සුළුතර පිරිසක් විසින් කරපින්නාගෙන ගමන් කරනු පෙනේ. එබැවින් විශ්වයේ බිහිවීම පිළිබඳව මෙතෙක් සොයාගෙන තිබෙන විද්‍යාත්මක තොරතුරුවලින් මෙම ලිපි මාලාව සකස් කරනු ලැබේ. ඉදිරියේදී කොටස් වශයෙන් මෙම ලිපි මාලාව ඉදිරිපත් කරනු ලැබේ. එහි අන්තර්ගතය මෙසේය

1. විශ්වය යනු කුමක්ද? චක්‍රාවාට/තාරකා/සුපර්නෝවා (Supernova)
2. විශ්වයේ උපත පිළිබඳ මතවාද
   - මහා පිපුරුම් වාදය (Big Bang)
   - ස්ථාවර තත්ව වාදය
   - නව ස්ථාවර තත්ව වාදය
   - ස්පන්දනමාන විශ්ව වාදය
3. විශ්වය බිහිවූ ආකාරය
   - හීලියම් හා හයිඩ්‍රජන් න්‍යෂ්ටි ඇතිවීම
   - ප්‍රථම පරමාණු ඇතිවීම
   - තාරකා ඇතිවීම
   - ගැලැක්සි හෙවත් මන්දාකිණි බිහිවීම
   - සූර්යයා හා ග්‍රහයෝ බිහිවීම
   - පෘථිවියේ බිහිවීම
4. විශ්වයේ වයස



විශ්වය යන වචනය අසන බොහෝ දෙනෙකු සිතන්නේ එය ඈත අභ්‍යවකාශයේ ඇති දෙයක් ලෙසිනි. එහෙත් එය එසේ නොවේ. අපට පෙනෙන-නොපෙනෙන, ඇසෙන-නොඇසෙන සියල්ල විශ්වයට අයත්ය. අපේ නිවස අප ජීවත් වන ගම නගරය හා රට මිනිසා ඇතුළු අවට පරිසරය ආදී සියල්ලම විශ්වයට අයත්ය. ඒ අනුව විශ්වය යනු ඉමක්-කොනක් කෙළවරක් දැකගත නොහැකි මුළුමහත් අවකාශය පුරා පැතිර පවතින ජීවී අජීවී සමස්ත ද්‍රව්‍යමය පද්ධතිය වේ. ඊට නිහාරිකා, චක්‍රාවාට, තාරකා, ග්‍රහලෝක, ධූමකේතු, ග්‍රාහක, වායු, දූවිලි ආදී අද පවත්නා සියලු දේ අයත්ය. මෙතෙක් පැවති සහ අනාගතයේ පවත්නා දේවල් ද ඊට අයත්ය.

මීට සියවසකට පෙර විද්‍යාඥයින් විශ්වාස කළේ සම්පූර්ණ විශ්වය යනු අප අයත් ක්ෂීරපථ මන්දාකිණිය පමණක් බවයි. කෙසේවෙතත් විසිවන සියවසේදී තාරකා විද්‍යාව, භෞතික විද්‍යාව හා තාක්ෂණයේ දියුණුවත් සමඟින්ම විශ්වය කොතරම් විශාලද යන්න තේරුම් ගෙන ඇත. තාරකා විද්‍යාඥයින් පවසනුයේ විශ්වය පිළිබඳ නොදන්නා කාරණා සියයට අනූවකට වඩා තිබෙන බවය.

අවුරුදු බිලියන ගණනකට පෙර ඇති වූ විශාල පිපිරීමකින් චක්‍රාවාට නිර්මාණය වූ බව විශ්වාස කෙරේ. මේවා අතිවිශාල ගුරුත්වයකින් එකිනෙකට බැඳී ඇති මිලියන බිලියන ගණනක් වූ තාරකා වායූන් සහ දූවිලි අංශුවලින් සැදුම්ලත් අන්තර් තාරකා මාධ්‍ය සහ අඳුරු පදාර්ථයන්ගෙන් සමන්විත පද්ධති විශේෂයකි. සාමාන්‍යයෙන් ගත් කළ චක්‍රාවාට, පොදු ගුරුත්ව කේන්ද්‍රය වටා භ්‍රමණය වන තාරකා, මිලියන දහසකින් පමණ සැදුම්ලත් ඒවායේ සිට බිලියනයක පමණ තාරකා ගහනයකින් යුතු යෝධ චක්‍රාවාට, දක්වා පරාසයක පැතිර පවතී. පැහැදිලි අහසක් ඇති රාත්‍රියක අහස දෙස බැලූ විට පවා අනන්ත අප්‍රමාණ තාරකා පෙනේ. ඒවා බොහොමයක් සෞරග්‍රහ මණ්ඩලයට සහ එය අයත් ක්ෂීරපථය ට අයත්ය.

තාරකාවක් යනු, ඉතා විශාල, දීප්තිමත්, ගුරුත්වාකර්ෂණ බලයෙන් යුතු ප්ලාස්මා එකට එකතු වී සෑදුණු ගෝලයකි. තරුවක ආයු කාලය අවසානයේ එය තුළ පිරිහුණු පදාර්ථ ප්‍රමාණයක් අඩංගු වේ. පෘථිවියට ළඟින්ම ඇති තාරකාව සූර්යයා වේ. පෘථිවිය මත ඇති ශක්තියෙන් බොහෝ ප්‍රමාණයකට මූලාශ්‍ර වනුයේ සූර්යයායි. අනෙකුත් තාරකා රාත්‍රී කාලයේදී පෘථිවියට දර්ශනය වන අතර සූර්යයා වඩා දීප්තියෙන් බබළන්නේ නැති අවස්ථාවන්හි දී හා වායුගෙ ්ලීය සංසිද්ධිවලින් අවහිර නොවූ අවස්ථාවන්හි දී අචල දීප්තිමත් ලක්ෂ සමූහයක් ලෙස බොහෝවිට දැකගත හැක. ඉතිහාසයේදී අහසේ වඩාත් හොඳින් මතු වී පෙනුන තාරකා එකිනෙක එකතු කොට තාරකා රාශි සහ තාරකා මණ්ඩල වශයෙන් හඳුනාගත් අතර වඩාත්ම දීප්තිමත් තාරකා සුදුසු ලෙස නම් කරනු ලැබීය. විද්‍යාඥයින් විසින් සකස් කරන ලද සවිස්තරාත්මක තාරකා නාමාවලියක්ද එළිදක්වා තිබේ.

සියලු ආකාරයේ තාරකා කිසියම් දිනෙක මිය යා යුතුය. එහෙයින් ඇතැම් තාරකාවක් ඉතා සංසුන්ව මිලින වී මියයන අතර ඇතැම් තාරකා මිය යන්නේ සුපර්නෝවා (supernova) නමින් හැඳින්වෙන ඉතාමත් ප්‍රචණ්ඩ වූ අතිශයින් දැවැන්ත පිපිරීමක් සමඟයි. සුපර්නෝවා අවස්ථාවකට පත් වී මිය යෑමට නම් තාරකාවක ස්කන්ධය අපේ සූර්යයාගේ ස්කන්ධය මෙන් අට ගුණයක්වත් විය යුතුය. සුපර්නෝවා පිපිරුමක් ඇති වන්නේ තාරකාව සතු හයිඩ්‍රජන් ඉන්ධන ප්‍රමාණය දැවී යාමෙන් පසුව තාරකාව රතු දැවැන්තයකු බවට ප්‍රසාරණය වීම නිසායි. මෙසේ ප්‍රසාරණය වන තාරකාවේ මදය වඩ වඩාත් ගිනියම් වීම නිසා හයිඩ්‍රජන් හා හීලියම් සංඝටනය වීමෙන් වඩාත් සංකීර්ණ වූ ඔක්සිජන්, කාබන් හා කැල්සියම් ද අනෙකුත් මූලද්‍රව්‍ය 86 ද බිහි වේ. ඊළඟට සිදුවන්නේ තාරකාවේ මදය කඩාවැටී supernova පිපිරීමක් සිදු වීමයි. එසේ තාරකාව පුපුරා යාමේදී තාරකාව තුළ බිහි වූ අළුු මූලද්‍රව්‍ය අවකාශයේ විසිරී ගොස් නව තාරකා බිහිකිරීමට දායක වෙයි. එය හරියට මියගිය සත්ව, ශාක හා ජීවීන් පසට ජීර්ණය වී යළි අලුත් ජීවීන් බිහි කිරීමට දායක වීම හා

## පරිසරය බිලිගනිමින් සිදුකරන 08 පිටුවෙන්...

ගොඩනැගුණු විශාල හෝටල් පද්ධතියක්ද බිඳවැටීමට ආසන්නය.

විදුලිබලාගාරය ආරම්භ වූ මොහොතේ සිට රාෆ්ටින් සිදුකරන ප්‍රදේශයේ ජලය සිඳී ගොස් භූගත උමඟින් එම ජලය ගලා යෑමට පටන් ගනී. එහි අනිවාර්ය ප්‍රතිඵලය වන්නේ ලංකාව තුළ මෙම ක්‍රීඩාව සිදුකළ හැකි එකම ගංගාව වන කැළණි ගඟේ කිතුල්ගල පිහිටි මෙම වැදගත්ම ප්‍රදේශය තුළ සිදුකෙරෙන ලෝක ප්‍රසිද්ධ මෙම ක්‍රීඩාව අතුරුදහන් වීමයි.

ලංකාවට ඉහළ විදේශ විනිමයක් ගෙන ආ සංචාරක පුරවරයක් වන කිතුල්ගලට මෙයින් පසුව සංචාරකයින්ගේ පැමිණීම ඉතා පහළ අගයක් ගැනීම අනිවාර්යයෙන් සිදුවන්නකි.

එසේ වුවද මෙම තත්වයට එරෙහිව පැවති රාජ්‍ය පාලන කාලයේ සිටම ඉතා දැඩි විරෝධයක් ප්‍රදේශයේ තරුණ පිරිස තුළින් එල්ල විය. එනමුත් එවකට තිබූ මර්දනකාරී දේශපාලන වටපිටාව තුළ සියල්ල බලහත්කාරයෙන් සිදුකෙරිණි. පවිත්‍රා දේවි, රංජිත් සියඹලාපිටිය වැනි එවකට ඇමතිධුර දරූ ප්‍රදේශයේ ප්‍රබලයින් රැසක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මැදිහත්ව කටයුතු කරන ලදී.

රටේ දේශපාලන තත්වය එසේ පවතින විට ජනතා විමුක්ති පෙරමුණත්, සමාජවාදී තරුණ සංගමයත් මෙම ගැටලුවට විසඳුමක් ලබා දීම වෙනුවෙන් මැදිහත් විය. එහිදී විසිරී සිටි ජනතාව සංවිධානය කරමින් සටනට නායකත්වය දෙන ලදී. ප්‍රදේශයේ තරුණ පිරිසෙන් ද ඊට ලැබුනේ නොමඳ සහයෝග යකි. එහි ප්‍රතිඵලයක් ලෙස මේ වන විට අධිකරණය මඟින් ''වයිට් වෝටර් රාෆ්ටින්'' ක්‍රීඩාව ආරක්ෂා කරගනිමින් විදුලිබල උත්පාදනයද සිදුකළ හැකි විධික්‍රමයක් පිළිබඳ අවධානය යොමු කොට ඇත. ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට, රාෆ්ටින් ක්‍රීඩාවේ නියැලෙන්නන්ට සහ මෙම ගැටලුව විසඳීමට මැදිහත් වූ ජ.වි.පෙට සහ සමාජවාදී තරුණ සංගමයටත් සාකච්ඡා කර විසඳුමක් ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. එම කාරණය මුල් කරගනිමින් බ්‍රෝඩ්ලන්ඩ් බලාග ාර බිමේදී පසුගිය සැප්තැම්බර් මස 7 දින පැවති සාකච්ඡාවක් සඳහා ජ.වි.පෙ. බස්නාහිර පළාත් සභා මන්ත්‍රී නීතීඥ සුනිල් වටගල සහ සමාජවාදී තරුණ සංගමයේ පරිසර ලේකම් අසිත නිරෝෂණ යන සහෝදරවරු සහභාගී වූ අතර පෙර පැවති තත්වයන්ට වඩා බොහෝ සුහද සාකච්ඡාවක් කරගැනීමට හැකි විය. ඉතාමත් නුදුරු දිනයකදී අතුරුදහන් වීමට තිබූ වයිට් වෝටර් රාෆ්ටින් ක්‍රීඩාව ප්‍රදේශයේ තරුණ කැළත් ජ.වි.පෙ සහ සමාජවාදී තරුණ සංගමයේත් මැදිහත් වීමෙන් තවදුරටත් ආරක්ෂා කරගත හැකි තත්වයකට පත්වීම ඉතා වැදගත් කරුණක් බව අවධාරණය කරනු කැමැත්තෙමු.

# ජනතාවට මානන උක් දඬු දුන්න

කන්තලේත්, හිඟුරානේත්, සෙවණගලත් හා පැල්වත්තේත් උක් ගැන සහ උක් මෙන්ම මිරිකුණු, රොඩුබොඩු බවට පත්වුණු සංස්කෘතික මිනිසා පිළිබඳ ඇත්තේ ශෝචනීය ඉතිහාසයකි. එසේම වර්තමානයේ තවත් උක් වගාවක් පිළිබඳ කතිකාව විසින් දේශපාලන භූමිය රත් කරන්නට පටන්ගෙන ඇත. ඒ ඌව වෙල්ලස්ස, බින්තැන්න යන ප්‍රදේශවලින් විශාල ඉඩම් ප්‍රමාණයක් විදේශිකයන්ට බදු දෙමින් සහ මහා පරිමාණ පරිසර හානියක් ඇති කරමින් බිහි කරන්නට යන නව උක් වගා ව්‍යාපෘතියක් හේතුවෙනි.

2006 වසරේ බ්‍රිතාන්‍යයේ බුකර්ටේට් සමාගම විසින් මුදල් ආයෝජනය කර ඇති අතර ලංකාවේ සමාගමක් වන අයි. එම්. එස්. (IMS) ගෝල්ඩන් සමාගම ඉල්ලා සිටියේ උක් වගාව සඳහා ලංකාවේ සුදුසු ප්‍රදේශවලින් අක්කර 65000 ක් ලබා දෙන ලෙසයි. ඒ සඳහා ඔවුන් යෝජනා කරන ලද්දේ නිල්ගල රක්ෂිතයේ ඉමහත් පාරිසරික හා ඓතිහාසික වටිනාකමක් සහිත ඉඩම්ය. ප්‍රබල ජනතා විරෝධතාවයක් මත එයින් ඉවත් වීමට ඔවුන්ට සිදු වූ අතර දෙවන ඉඩම ලෙස සේනානායක සමුද්‍රයේ ඉහත්තාව ඉල්ලන ලදී. එයද ජනතා විරෝධය හමුවේ පසු බැස ගිය අතර ඊළඟට රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මාදුරුඔය රක්ෂිතයේ ඉඩම් ඒ සඳහා ලබාදෙන ලෙස ඉල්ලන ලදී. තෙවනුව ඉල්ලන ලද ඉඩම ශ්‍රී ලංකාවේ විශාලතම ස්වභාවික කටු උණ ගහනයක් සහිත ඉඩමක් වන අතර, එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිළිගන්නා පරිදි ප්‍රාග්ඓතිහාසික මානවයාගේ වාසස්ථානයක් සහ වසර 3000ක් තරම් පැරණි ශිලාමය සාක්ෂි සහිත භූමියකි. පැරණි ස්ථූප, ගල් කැටයම්, කටාරම්, ශිලා ලේඛන, ගල් ලෙන්, පුරාණ වැව්, පුරාණ ගොඩනැගිලිවල අවශේෂ මේ ප්‍රදේශය පුරා පිහිටා ඇත.



උක්ත ඓතිහාසික හා පාරිසරික කාරණා නිසාවෙන් උක් ව්‍යාපෘතියක අවාසි සහ විනාශය පිළිබඳව අධ්‍යයනයක යෙදුණු ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ සංවිධානය සමඟ ප්‍රදේශයේ ජනතාව පෙළගැසී එය විශාල ජනතා විරෝධතාවයක් ලෙස පැනනැගුණි. කොටින්ම කිවතොත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ සහ බුකර්ටේට් සමාග-මේ ඉඩම් කොල්ලය වසර 11 ක් තරම් දුරකට එළවා දමන ලදී. එහෙත් අද දවසේ නැවත වටයකින් එය ආරම්භ වී ඇත.

පසුගිය ජූනි මාසයේ යෙදුණු පරිසර දිනය දා බදුල්ල, රිදීමාලියද්ද, දෙනිගම ග්‍රාමයේදී තවත් උක් සමාගම් ව්‍යාපෘතියක් සඳහා මුල්ගල තියන්නට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, පරිසර විෂය භාර ඇමතිවරයා ලෙස සූදානම් විය. මෙලෙස එකී නව සමාගම වන සිංගප්පූරුවේ ගැසල් වෙන්චර්ස් සමාගම සහ එහි හවුල්කාර සමාගම වන අයි.එම්.එස්. ගෝල්ඩින් සමාගම සමඟ ගිවිසුමකට එළඹීම යනු, රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුවේ අධිරාජ්‍ය ගැති ස්වභාවය මනාවට ඔප්පු කරන ලද්දකි. යහපාලන දැක්ම පෙරටු කොටගත් පාලකයන් ලෙස මොවුන් සිදුකරන්නට යන පරිසර හානිය ලෝකයේ කිසිඳු විනිමය වර්ගයකින් ගණන් තැබිය නොහැකි බව ඔවුන් නොදන්නවා නොවේ.

එදා බුකර්ටේට් සමාගම මේ උත්සාහය අත්හැර ගියද ඊට පසුව තායිලන්තයේ ''ෂූ ටෙක්'' නමින් සමාගමක්ද, චීනයේ ''ගුවැන්ෂි ෆාර්ම් ෂුගර්'' සමාගමද, උක් ව්‍යාපෘතියට අතගැසූ මුත්, ටික කලෙකින් ඔවුන්ටද එය අතහැර යන්නට සිදු විය. එහෙත් රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුවේ ආනුභාවය මත ''සීමා සහිත ගැසල් වෙන්චර්ස්'' සමාගම විසින් අමානුෂික කොන්දේසි ගණනාවක් සහිතව ආණ්ඩුවේ දුර්වල සහ බෙලහීනතාවය දඩමීමා කරගෙන උක් සමාගම නමින් වහල් කඳවුරක්, වහල් වෙළෙඳ පොළක් නිර්මාණය කරන්නට සැලසුම් සකස් කරමින් සිටී.

අධිරාජ්‍යවාදීන් විසින් ඇති කළ අනෙකුත් වතුවගාවන් විසින්ද ඉතා දැඩි පරිසර හානියක් ඇති කර ඇති මුත් ඊටත් වඩා භයානක ප්‍රතිඵලයක් උක් වගාව හරහා විඳීමට සිදුවීම නියතයකි. කන්තලේ, හිඟුරාන, සෙවණගල සහ පැල්වත්තේ ආරම්භ කළ උක් ව්‍යාපෘතිය දශක තුනක් යන්නටත් ප්‍රථම අසාර්ථක ව්‍යාපෘතියක් බවට පත්වී සහ විශාල පරිසර හානියක් මේ බිමට ගෙන දී ඇත්තේ ඒ නිසාය. එවන් ඉතිහාසගත අත්දැකීම් සහිතව දිවි ගෙවන වර්තමානයට තවත් උක් ව්‍යාපෘතියක් යනු රෑ වැටුණු වළේ දවල් ද වැටීමකි.

අක්කර 80000කටත් වඩා වැඩි භූමියක් සහමුලින්ම මුඩු බිමක් බවට පත් කරමින් ඉදිකළ මෙරට විශාලතම උක්වගා ව්‍යාපෘතිය වන පැල්වත්ත සීනි සමාගම මෑත කාලයේ වේදනා විඳිමින් මරණය කරා ඇදෙන අපේ කාලයේ නරකම අත්දැකීමයි. ඉතිහාසයේ එය ඌව වෙල්ලස්ස ධාන්‍යාගාරය ලෙස නම් කරන ලද වැව් අමුණු 400කටත් වඩා තිබූ භූමියක් බව කවුරුත් දන්නා කරුණකි. වහල් ජනපද 16කින් හා විශාල කර්මාන්ත ශාලාවකින් සමන්විත වුවද අද වන විට එහි ප්‍රධාන නිෂ්පාදනය බවට පත් වී ඇත්තේ සීනි වෙනුවට එතනෝල්ය.

2017 වසරේ යෝජිත මේ නව උක් ව්‍යාපෘතියේ ද මුඛ්‍ය අරමුණ වන්නේ එතනෝල් නිෂ්පාදනයයි. ඒ හරහා විශාල මධ්‍යසාර නිෂ්පාදනයක් සහ මත්ද්‍රව්‍ය පාරිභෝගික පිරිසක් ඉලක්ක කර ඇති අතර සීනි නිෂ්පාදනය එහි දෙවැනි පියවරයි. රිදීමාලියද්දේ ඉදිකිරීමට යෝජිත විශාල ස්කාගාරය හරහා මතු වෙන්නේ එහි අනතුර වන අතර බදුල්ල දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද, මහියංගනය හා ලුණුගල ද අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව හා මහඔය ද, මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල, මැදගම සහ මඩුල්ලද යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එම ව්‍යාපෘතියේ ගොදුරු ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව ලංකාවේ දුප්පත්කම වැඩිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණයට වැටෙන මෙම ප්‍රදේශවල ජනතාව හා අතිවිශාල ස්වභාවික සහ පෞරාණික වටිනාකම් රැසක්ද විනාශමුඛයට යාමට නියමිතව ඇත.

යෝජිත නව උක් ව්‍යාපෘතිය අක්කර 62500ක් යැයි මුලින් ඇස්තමේන්තු කර ඇත. ඊටත් අමතරව තාවකාලිකව ලාභ පෙන්වා මානසික අල්ලස් මත ගෙවතු ඉඩම්ද උක්ත ව්‍යාපෘතියට

ඈඳාගැනීමට ඉලක්ක කර ඇත. එකී යෝජනාවට අනුව වසරකට එතනෝල් ස්ප්‍රීත්තු ලීටර් 10,000,000 (කෝටියක්) නිෂ්පාදනය කරන්නට අපේක්ෂා කරන අතර, අක්කර 62500කින් එතරම් නිෂ්පාදනයක් කරන්නට නොහැකි බව පැල්වත්ත ස්කාගාර අත්දැකීමෙන් ඔප්පු කර ඇත. පැල්වත්තේ අක්කර 80000 කින් නිෂ්පාදනය කරන්නේ ඊට අඩකටත් අඩු තරම් එතනෝල් ප්‍රමාණයකි. එසේ නම් උක්ත පීඩිත ප්‍රදේශවල ජනතාවට තම ගෙවතු එළිපෙහෙළි කර උක් සමාගමට කුණු කොල්ලයට විකිණීමට වක්‍රාකාරව කරන බලපෑම් රහසක් නොවේ.

එක් අතෙකින් ව්‍යාපෘති යෝජනාවකට අනුව උක් සමාගමේ ඉඩම් ජනතාවට වසර පහකට බදු දීමට යෝජනා කරන අතර, එහෙත් එම ඉඩම්වල අයිතියක් කිසිදා ගොවියන්ට පවරනු නොලැබේ. අනිත් අතින් එසේ පවරනු ලබන අක්කර 05 ක වාර්ෂික අස්වැන්න දළ වශයෙන් උක් ටොන් 130ක් පමණ වන අතර, එම උක් සමාගම විසින් මිල දී ගනු ලබන්නේ ටොන් එකක් රුපියල් 5000 බැගිනි. අක්කර 5ක වගාවක් සඳහා කම්කරුවන් 07 දෙනෙකුගේ ශ්‍රමය අවශ්‍ය වන අතර, ඒ අනුව දෛනික අදායම වන්නේ රුපියල් 254 ක. පමණ මුදලකි.

එසේම බෙලහීන රනිල්-මෛත්‍රී හවුල් ආණ්ඩුව විසින් අත්සන් කරන්නට යෙදුණු උක්ත ව්‍යාපෘති ගිවිසුමට අනුව ආණ්ඩුවට හිමිවන වාසිය නම් සමස්ථ ව්‍යාපෘතියේ ලාභයෙන් 01%කි. එසේ නම් ඉතිරි ලාභය යන්නේ කාටද? විදේශීය සමාගම වන සිංගප්පූරුවේ "ගැසල් වෙන්චර්ස්" සමාගමට 89% කුත් ලංකාවේ අයි.එම්.එස් සමාගමට 10% කුත් වශයෙන් ලාභ බෙදා ගැනීමට යෝජිත අතර ඒ හැරෙන්නට ලංකාවේ භූමිය, ශ්‍රමය, ජලය හා ප්‍රවාහනය, ආදී සියල්ලටම හිමිවන්නේ ඉතා අල්ප ලාභයකි. එසේනම් උක්ත ව්‍යාපෘතිය ඇත්ත වශයෙන්ම විදේශීය ආයෝජනයක් නමින් එන නව නිෂ්පාදන ව්‍යාපෘතියක් ද, එසේත් නැතිනම් යළි යටත් විජිතකරණය සඳහා IMF සහ ලෝක බැංකුවේ සෘජු බලපෑම් හි ප්‍රතිඵලයක් ද යන්න වටහාගත යුතුව ඇත.

ඌව වෙල්ලස්ස ජන අයිතීන් සුරැකීමේ සංවිධානය ප්‍රමුඛව ලංකාවේ ප්‍රසිද්ධ පරිසරවේදීන් හා ජනතාව එක හඬින් කියා සිටින්නේ, උක්ත ඌව වෙල්ලස්ස, බින්තැන්න නව උක් ව්‍යාපෘතිය ඉමහත් විනාශකාරී සහ අනාගතයේ දී මහත් හානි පමුණුවන අදූරදර්ශී ක්‍රියාමාර්ගයක් බවයි. එය වර්තමාන ආණ්ඩුවේ ආයුෂ කෙටි කරන්නට තරම් බලසම්පන්න අරගලයක් බවට ද අද දවසේ පත්ව ඇත. අවසානයේ බහු ජාතික සමාගම් විසින් සූරාකෑම සඳහා මෙවර ජනතාවගේ හිස මතට උක්දඬු දුන්නක් මානා ඇත. එහෙත් ඌව වෙල්ලස්ස, බින්තැන්න ජනතාව විසින් පාලකයන්ට එදිරිව මානන දුන්න, අරගලයේ බරින් සහ ධෛර්යයෙන් වඩාත් වක්‍රව ඇදී ගොස් ඇත. එය නිසැකව එල්ලය කරා ගමන් කරනු ඇත.



අවුරුදු 200කට වැඩි කාලයක් තිස්සේ සුද්දගෙන් බැට කන අපි 1815 ඉඳන් අද වන තුරුත් කන පරිප්පුව ගැන මේ රටට, විශේෂයෙන්ම මේ රටේ තරුණ ඔබට අමුතුවෙන් කිව යුතු නොවේ. සුදු සුද්දන්ගෙන් කළු සුද්දන් අතට දේශපාලන බලය හුවමාරු වීමෙන් පසුත් අවුරුදු 70කට ආසන්න කාලයක් තිස්සේ අපි ධනවාදයේ පරිප්පුව කන්නෙමු. ලංකාවේ පසුගාමී ධනවාදය නොහොත් නොදියුණු ධනේෂ්වරය තුළ පීඩාවට පත් දනන් කළු සුද්දන් විසින් ජාතිකත්වයන් මෙන්ම කුල හා දේශපාලන පක්ෂ ලෙසත් තවත් විවිධාකාර ලෙසත් බෙදා වෙන්කොට පීඩාවෙන් පීඩාවට හෙළන ලදී. ඔවුන්ට ගැටුම්, ඇනකොටාගැනීම් හා මරාගැනීම් සමඟ පරිප්පුව නොඅඩුව ලැබුණි. යුද්ධය නිසා හරිහමන් කෑමක්, බීමක්, ඇඳුමක් පැළඳුමක් නොලැබෙන්නේ යැයි සිතූ ජනතාව යුද්ධය අවසන් වන තුරුම පටි තද කරගෙන සිටියහ. එසේම 2009 න් පසුව අලුත් පරිප්පුවක් කෑමට සූදානම් විය. යුද්ධය අස්සේ සිටි හොර තක්කඩින් යුද්ධයෙන් පසු එළිපිටම නටන්නට පටන් ගත්හ. ඒ අතරම ජාතිකත්වයන්, කුල හා දේශපාලන පක්ෂ බෙදීම් යටකරගෙන නියම සමාජ බෙදීම මතුවන්නට විය. ලාංකීය ධනවාදයේ අර්බුදය වසා සිටි යුද්ධයෙන් පීඩාවට පත් අපේ මිනිසුන් තම ජීවිතය තුළ වන බේදවාචකයේ තරම ඉතා හොඳින් දකින්නට පටන්ගෙන තිබේ. අද වන විට පාලකයා හා ජනතාව අතර විරසකය ඉතා තියුණු ලෙස වර්ධනය වෙමින් පවතී. ඉදින් ජනතාව ඊළඟ පරිප්පුව පාලකයින්ට දීමට සූදානම් විය යුතුය. ඒ සඳහා තරුණ ඔබට එහි සුවිශේෂී කාර්යභාරයක් ඇති බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## 19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළලේ සූදානම් කිරීමේ කටයුතු සඳහා SYU නියෝජිතයෙක්




19 වන ලෝක තරුණ හා ශිෂ්‍ය උළලේ සූදානම් කිරීමේ කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා ජාතික සූදානම් කිරීමේ කමිටුව නියෝජනය කරමින් සමාජවාදී තරුණ සංගමයේ වෛද්‍ය ලසන්ත අබේවර්ණ සහෝදරයා පසුගිය දා රුසියාව බලා පිටත් විය. ඔක්තෝම්බර් විප්ලවයට වසර 100ක් සපිරීම නිමිත්තෙන් මෙවර ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙල රුසියාවේ දී පැවැත්වීමට තීරණය කර ඇත.

එය ඔක්තෝම්බර් 14 සිට 22 දක්වා රුසියාවේ සෝචි නුවර දී පැවැත්වීමට නියමිතය. මේ සඳහා ලෝකයේ ප්‍රගතිශීලී තරුණ හා ශිෂ්‍ය සංවිධාන රැසක සාමාජිකයින් විශාල පිරිසක් සහභාගී වීමට සූදානමින් සිටී. මෙම තරුණ උළෙල සෑම වසර 4කටම වරක් සංවිධානය කෙරෙන්නේ ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනය මඟිනි. සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික පුබුදු සමරවීර සහෝදරයා මෙහි උප සභාපති ධූරයක් දරයි.

## සයිප්‍රසයේ අකෙල් (AKEL) පක්ෂයේ තරුණ සමුළුවට SYU සහභාගී වේ



සයිප්‍රසයේ අකෙල් පක්ෂයේ තරුණ සංගමයේ වාර්ෂික සමුළුව පසුගිය ජූලි 5,6,7 දිනයන්හි සයිප්‍රසයේදී පැවැත්වීය. ඊට ඔවුන්ගේ ආරාධනයෙන් සමාජවාදී තරුණ සංගමයේ සයිප්‍රස් කමිටුවේ නියෝජිතයෙක් සහභාගී විය. එම අවස්ථාවට සහභාගී වූ චේ ගුවේරා සහෝදරයාගේ දියණිය වන සෙලියා ගුවේරා (Celia Guevara) SYU ප්‍රකාශන කුටිය වෙත පැමිණ ප්‍රකාශන මිලදී ගත් අවස්ථාවක් ද ඡායාරූපය මඟින් දැක්වේ.



# සහෝදරත්වය රැගෙන ත්‍රිකුණාමලයට





සමාජවාදී තරුණ සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරන සහෝදරත්වයේ දිනය මෙවරත් ජූලි 23 දින පැවැත්වීය. ඒ වෙනුවෙන් සංවිධානය කරන ලද සහෝදරත්වයේ තෙදින මෙහෙයුම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පැවැත් වූ අතර "ජාතිවාදය කා සඳහාද?" සම්මන්ත්‍රණය කොළඹ දී පැවැත්විය. තෙදින මෙහෙයුම ජූලි 21 සිට 23 දක්වා පවත්වන ලද අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගල්කඩවල, අව්වේ නගර්, මුතූර් නැගනහිර හා විලාන් කුලම් යන ගම්මානවලදී විවිධ වැඩසටහන් පැවැත්වීය. එහි දී වෛද්‍ය සායන, වකුගඩු සායන, චිත්‍ර වැඩමුළු, ශ්‍රමදාන, වතුරෆිල්ටර් අලුත් වැඩියාව සහ සංස්කෘතික ප්‍රසංග ආදි විවිධ වැඩසටහන් පවත්වමින් ජාතිකත්වයන් අතර සමගිය හා සහෝදරත්වය වර්ධනය කරවීමට උත්සහ ගැනුණි.

එසේම ජූලි 23 දින ත්‍රිකුණාමල නගරයේදී "ජාතිවාදය එපා! සිංහල දෙමළ මුස්ලිම් අපට එක්ව ඉන්න ඉඩදියව්" යන මැයෙන් දැවැන්ත උද්ඝෝෂණ පාගමනක් හා රැලියක් පවත්වල ලදී. මෙම උද්ඝෝෂණ පා ගමන සඳහා සිංහල, දෙමළ, මුස්ලිම් තරුණ තරුණියන් විශාල පිරිසක් සම්බන්ධ වූහ.

ජූලි 31 දින දීද ඉහත තේමාව යටතේම තවත් උද්ඝෝෂණයක් හා "ජාතිවාදය කා සඳහාද?" යන මැයෙන් සම්මන්ත්‍රණයක් කොළඹ දී පැවැත්වීය. උද්ඝෝෂණය කොළඹ විහාරමහා දේවී උද්‍යානය ඉදිරිපිට දී පැවැත්වූ අතර සම්මන්ත්‍රණය කොළඹ, මහජන පුස්තකාල ශ්‍රවනාග ාරයේ දී පැවැත්වීය. මේ සඳහා ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා, සාමය සඳහා වූ ජාත්‍යන්තර තරුණ එකමුතුවේ තිරුකුමාර් ප්‍රේමකුමාර් මහතා, අශෝක් ස්ටීවන් පියතුමා හා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා ද සහභාගී වූහ.







# SYU හා ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිනිය අතර හමුවක්



සමාජවාදී තරුණ සංගමය හා ශ්‍රී ලංකාවේ කියුබානු තානාපතිනි ජුවානා එලේනා රොද්‍රිගෝ මහත්මිය අතර හමුවක් සැප්තැම්බර් 04 දින කියුබානු තානාපති කාර්යාලයේදී පැවැත්විණි. ඒ සමාජවාදී තරුණ සංගමය සෑම වසරකම ඔක්තෝබර් 08 දින පවත්වනු ලබන "චේ දිනය" පිළිබඳ දැනුවත් කිරීම සඳහාය. ලොවපුරා වෙසෙන තරුණ තරුණියන්ගේ ආදරය සහ ගෞරවය දිනාගත් අසහාය විප්ලවවාදියෙකු වූ අර්නෙස්ටෝ චේ ගෙවාරා සහෝදරයාව අධිරාජ්‍යවාදීන් විසින් ඝාතනය කර මෙම වසරේ ඔක්තෝම්බර් මස 08 වැනි දිනට වසර 50 ක් සපිරීමද විශේෂත්වයකි.

මෙම හමුව සඳහා සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් අංජන සම්පත් අමරසිංහ සහෝදරයා සහභාගී වූහ.

මෙහි දී දෙරට අතර දේශපාලන කරුණු සාකච්ඡා වූ අතර විශේෂයෙන්ම එක්සත් ජනපදය විසින් කියුබාවට පනවනු ලැබූ ආර්ථික සම්බාධකවලට තම සංගමය එකහෙළා විරුද්ධ වන බවත් එරංග ගුණසේකර සහෝදරයා විසින් පැවසීය.

එහි දී අදහස් දැක්වූ එලේනා රොද්‍රිගෝ මහත්මිය ප්‍රකාශ කර සිටියේ එක්සත් ජනපදයේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් කියුබාවට එරෙහිව කටයුතු කළ ද ලෝකයේ අනෙකුත් රාජ්‍යන් සමඟ කියුබාව පවත්වනු ලබන සුහදශීලී රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා හේතු කොටගෙන එක්සත් ජනපදයේ ක්‍රියාමාර්ග යන් පරාජය කරමින් තම රට ශක්තිමත්ව නැගී සිටින බවයි.

# ගංවතුරෙන් හානි වූ වේල්ල කදිරගොඩ තරුණ සමිතියෙන් පිළිසකර කෙරේ



පසුගියදා තංගල්ල ප්‍රාදේශීය සභාවේ රන්න කට්ටකඩුව කොට්ඨාසයේ කදිරගොඩ ගම්මානයට බලපෑ ගංවතුරින් හානියට පත් වේල්ල පිළිසකර කිරීමේ මහා ශ්‍රම මෙහෙයුමක් සැප්තැම්බර් 05 දා ක්‍රියාත්මක විය. එය කදිරගොඩ තරුණ සමිතිය හා කදිරගොඩ දිරිය පුරවැසි සමිතිය එක්ව සංවිධානය කළ අතර කදිරගොඩ තරුණ සමිතියේ සභාපති ප්‍රමිත් සුරංග සහෝදරයා සහ ජ.වි.පෙ. හිටපු ප්‍රදේශීය සභා මන්ත්‍රී රුවන් සෙනරත් සහෝදරයා ඇතුළු ගමේ තරුණ තරුණියන් විශාල පිරිසක් ඊට සහභාගී වූහ.

# සටන් කරන උන් වෙනුවෙන් අරගලයට ගී ගැයෙයි!



මාලඹේ සයිටම් හොර උපාධි කඩය අහෝසි කරන ලෙස බලකරමින් සයිටම් විරෝධී ජන පවුර මඟින් සංවිධානය කර තිබූ ජාතික විරෝධතා දිනය (අගෝ.02) වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය විසින් කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී "සටන් කරන උන් වෙනුවෙන් අරගලයට ගැයෙන ගී" මැයෙන් විරෝධතා වැඩසටහනක් පැවැත්වීය. එහිදි අත්පත්‍රිකා බෙදාදීමක්, විරෝධතා ගී ප්‍රසංගයක් හා විරෝධතා වැකි පළ කළ බැලුම් ගුවනට මුසුකිරීක් ද සිදුවිය. ඒ සඳහා ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත සහෝදරයාත් සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයාත් සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නියෝජනය කරමින් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයාත් සහභාගී වූහ.

# වව්නියාවේ රාත්‍රී අත්පන්දු තරඟාවලියක්



සමාජවාදී තරුණ සංගමයේ වව්නියාව දිස්ත්‍රික් කමිටුව හා මහමයිලංකුලම "තරුණ තරු" ක්‍රීඩා සමාජය එක්ව වව්නියාව මහමයිලංකුලම ප්‍රදේශයේ දී පසුගිය අගෝස්තු 12 දා සවස සිට පසු දින උදෑසන දක්වා රාත්‍රී අත්පන්දු තරඟාවලියක් පැවැත්වීය.

එහි ආරම්භක අවස්ථාවට සහ ජයග්‍රාහකයින්ට තිළිණ ප්‍රධානය කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා සහ ජ.වි.පෙ. වව්නියාව දිස්ත්‍රික් සංවිධායක උපාලි සමරසිංහ සහෝදරයා එක් වූහ.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 52/3, අතුරුගිරිය පාර, හෝමාගම පිහිටි ක්‍රියේටිව් ස්ටැම්ප් ඇන්ඩ් ප්‍රින්ටින් ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.